ධර්මදානය පිණිස යි.

# අසිරිමත් දානය

සම්පාදක

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

# ඇසිරිමත් දානය

සම්පාදක

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | : මැදින්/2547 | (2004 මාර්තු) |
| දෙවැනි මුද්‍රණය | : වප්/2550 | (2006 ඔක්තෝබර්) |
| තෙවැනි මුද්‍රණය | : දුරුතු/2550 | (2006 දෙසැම්බර්) |
| සිවුවැනි මුද්‍රණය | : දුරුතු/2550 | (2007 ජනවාරි) |
| පස්වැනි මුද්‍රණය | : ඇසළ/2551 | (2007 ජූලි) |
| සයවැනි මුද්‍රණය | : නිකිණි/2551 | (2007 අගෝස්තු) |
| සත්වැනි මුද්‍රණය | : පොසොන්/2552 | (2008 ජූනි) |
| අටවැනි මුද්‍රණය : සංස්කරණය I | : බක්/2552 | (2009 අප්‍රියල්) |

Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007

*ශ්‍රී සද්ධර්ම සංසදයෙන් ප්‍රකාශිත වෙනත් ධර්මග්‍රන්ථ*

## පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ.

- අසිරිමත් දනය
- සුපිරිසිදු නිවන් මග
- ධම්මචක්කප්පවත්තන සූත්‍රය සහ අමාදම්ඇස පහළ වීම
- ආනාපානසති භාවනාව
- ඉරියාපථ භාවනාව සහ සම්පජඤ්ඤ භාවනාව
- තෙරුවන් වන්දනාව, සෙත් පිරිත් සහ තෙසැත්තෑඤාණ වන්දනාව
- ධම්මානුස්සති භාවනාව
- පටික්කූලමනසිකාර භාවනාව (පිළිකුල් භාවනාව)
- පින සහ කුසලය එකක් ද? දෙකක් ද?
- කර්මය පිළිබඳ අගනා දෙසුමක් (චූළකම්මවිභඞ්ග සූත්‍රය)

## පූජ්‍ය දිප්පිටිගොඩ සෝමශාන්ත ස්වාමීන් වහන්සේ.

- ධාතුමනසිකාර භාවනාව
- නවසීවථික භාවනාව
- බුද්ධානුස්සති භාවනාව

## බන්දුල ආනන්ද පෙරේරා.

- පරාභව සූත්‍රදේශනාව සහ මහාමඞ්ගල සූත්‍රදේශනාව

නැවත මුද්‍රණය සඳහා, සියලු විමසීම්,

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
රයියාදෙළුව, උග්ගල්බොඩ, ගම්පහ.

**Tel : 071 - 4417813**
**E-mail : info@sadaham.net**
**Web : www.sadaham.net**

## ධර්මදානය සඳහා දයකත්වය

* නුගේගොඩ, කන්දවත්ත පාරේ පින්වත් සමරවික්‍රම මහත්මා සහ මහත්මිය විසින් අභාවප්‍රාප්ත දිනේෂා ගුණවර්ධන දියණියට සහ කේෂාන් ගුණවර්ධන මුනුබුරුට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස,

මෙම ධර්මදානය සිදු කරන ලදී.

--*--


**ප්‍රකාශනය**

ශ්‍රී සද්ධර්ම සංසදය

**ධම්මාරාම යෝගාශ්‍රමය**

**රයියාදෙළුව, උග්ගල්බොඩ, ගම්පහ.**

**විමසීම්:-** 071 - 4417813

වෙබ් අඩවිය: www.sadaham.net

වෙබ් අඩවිය සඳහා දයකත්වය

e-Artefacts Technologies

**305/5, Hansagiri Road, Gampaha.**

**Tel: 071-4417813, 077-3021777**

**Web: www.eartefacts.com**

# පෙරවදන

මිනිසුන් තුළ පහළ වන ලෝභකම වනාහි අපිරිසිදු සිතිවිලිවලින් එකකි. එය මසුරුකමට මුල ය. මෙම මසුරුකම මිනිසාගේ දියුණුවට නොව පිරිහීමට මගක් වෙයි. ඇතැම් උදවියගේ මෙබඳු වැරදි අදහසක් ඇත. එනම් 'අරපරිස්සම, මසුරුකම ය' යි, යන්න. එය එසේ නො සිතනු. 'අරපරිස්සම' ඉතා වටිනා ගුණයකි. හැම තැන දී ම හැම දෑයෙහි දී ම ප්‍රමාණයට වියදම් කිරීම නිසා මිනිසෙක් සාධාරණ ලෙස හරි මගින් දියුණු වෙයි. අවස්ථානුකූල ව අවශ්‍ය දෙය සොයා බලා කම්පල අදහා ගෙන සොම්නස් සිතින් පරිත්‍යාග කිරීම ජීවිතයට විශාල පිහිටක් ඇති කර ගැනීමකි.

ත්‍යාගශීලීභාවය යහපත් ගුණයකි. යහපත් දෙයකට සිත නැමෙන්නේ සිත ගුණයෙන් උසස් වූ විට ය. දනය පුරුදු කරන්නට නම් මසුරුමල අඩු ගතියක් සිතෙහි තිබිය යුතු ය. මිනිසුන් තුළ මේ ත්‍යාගශීලී උසස් සිත නිතර ම නො පවතී. මේ මොහොතේ දන් දෙන තැනැත්තා ඊළඟ මොහොතේ දී මසුරු වෙයි. මෙසේ සිදු වන්නේ පෘථග්ජන බව නිසා ය. සෝතාපන්න පුද්ගලයාට මෙය නැත. හේතුව, ශ්‍රද්ධාව වෙනස් වන්නේ නැති නිසා ය. එම නිසා ම '**නියතෝ සම්බෝධිපරායණෝ**' යනුවෙන් සෝතාපන්න පුද්ගලයා පිළිබඳ ව වදරා ඇත. දීම නිසා, තමාට ම තමාව ප්‍රිය වෙයි. අනුන්ටත් ප්‍රිය වෙයි. එය බොහෝ විට තමාගේ නිරාමිස ප්‍රීතිය පිණිසත් හේතු වේ. පැලලුප් නුවර රාජ්‍යය කර වූ මහාසේන රජතුමා හා ඔහුගේ සහෝදරිය අප්‍රකට වෙසින් දුර පළාතකට ගොස් සිටුවරයෙකු ළඟ බැලමෙහෙකම් කළේ ස්වකීය ශරීරය වෙහෙසා උපයාගත් ධනයෙන් දන් දීම මහත් ආනිසංසදායක ය'යි අසා තිබුණු නිසා ය. තුන් අවුරුද්දක් කුලී වැඩ කර ලබා ගත් ධනයෙන් දන් දී එයින් ලැබුණු ප්‍රීති-ප්‍රමෝදය මේ දෙදෙනාට ම එම ජීවිතයේ දී ම සෝතාපන්න වීමට හේතු විය.

වර්තමානයෙහි බෞද්ධ වූ ද අන්‍යාගමික වූ ද බොහෝ දෙනා දන් දෙති. කෙබඳු ආගමක් අනුගමනය කළත්

ලෝභ, ද්වේෂ, මෝහ ආදි කෙලෙස්වලින් නො බැඳී, පරිත්‍යාග චේතනාව බලවත් කර ගෙන, ලබන්නා කෙරෙහි තරහක් නැති ව, 'මතු විපාකයක් මෙම පිනෙන් ලැබේ, මෙයින් මාහට අනාගතයෙහි යහපතක් වන්නේ ය' යන කර්මඵල විශ්වාසය ඇති ව, එම යහපත් දේ කළා නම් එය පිනකි. මෙම ධර්මග්‍රන්ථය තුළින් එම කරුණු සූත්‍රදේශනාවන්ගෙන් මතුකර ගෙන උදහරණ වශයෙන් පෙන්වා දී ඇත. මෙම ග්‍රන්ථය දනාදි පින් කරන උදවියට ඉදිරි මග දක්වන ආලෝකයක් බඳු ය'යි වැටහේ. මෙම ග්‍රන්ථය සම්පාදනය කළ පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ ගත් උත්සාහය සඵල වේවා. එම ස්වාමීන් වහන්සේගේ පැවිදි ජීවිතය සාර්ථක වේවා' යි ආශංසනය කරමි.

**මෙයට,**

**සසුන් ලැදි,**

**මීතලාවේ විනීත ස්ථවිර,**
**විපස්සනා භාවනා මධ්‍යස්ථානය,**
**දික්හේන,**
**පොල්ගස්ඕවිට.**

# හැඳින්වීම

තුන්ලෝකාග්‍ර වූ අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ 'දානය' පිළිබඳ ව වදාරා ඇති බුද්ධදේශනාවන් එක්තැන් කෙරෙමින් 'අසිරිමත් දානය' නම් වූ මෙම ධර්මග්‍රන්ථය සංග්‍රහ කරන ලදී. මෙම ග්‍රන්ථය සැකසීමට පාදක වූයේ මීට වර්ෂ කිහිපයකට පෙර 'දානය' මුල් කර ගෙන අප විසින් සිදු කළ ධර්මදේශනාවකි. බුදුසසුනෙහි ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවන් අතරින් පළමුවැන්න වූ දානය පිළිබඳ ව සූත්‍රපිටකයෙහි සඳහන් කරුණු විමසා බැලීමේ දී බුදුරජාණන් වහන්සේගේ විස්මිත අවබෝධය තුළින් වදාළ 'බුදුසසුනේ-දානය' කෙතරම් ආනිසංසදායක කුසල කර්මයක් ද යන්න වටහා ගත හැකි වෙයි.

දාන - ශීල - භාවනා ආදි කුසල ධර්මයන් උසස් ලෙස සපුරා ගෙන නිවන් මග විවර කර ගන්නට බුද්ධෝත්පාද කාලය තරම් වෙනත් සුදුසු අන් කාලයක් නැත. එනිසා මෙහි සඳහන් ලෙස දානමය කුසල කර්මයන් මෙන් ම අවශේෂ කුසල කර්මයන් පිළිබඳ ව ද කරුණු මැනවින් උගෙන පින්කම්හි යෙදෙමින් නිවන් මග නො පමා ව සපුරා ගැනීමට සත්පුරුෂයෝ වෑයම් කරත්වා.

මෙම ධර්මග්‍රන්ථය මුල් වරට සකස් කරන ලද්දේ අස්ගිරිවල්පොළ, පියසේන තෙන්නකෝන් උපාසක මහත්මාගේ ආරාධනාවෙනි. දෙවැනි වර සිදු කළ සංස්කරණයට පසුබිම් වූයේ තලවතුගොඩ ශ්‍රී ඥානාරාම භාවනා මධ්‍යස්ථානාධිවාසී පූජ්‍යපාද අධිකාරිගම සන්තසුමන ස්වාමීන් වහන්සේගේ ධර්මදානමය සංකල්පනාවකි.

මෙම ධර්මසඞ්ග්‍රහය සම්පාදනය කිරීමෙන් අප ජනිත කර ගත් ධර්මදානමය කුසල සම්භාරය අපගේ පරම පූජනීය උපාධ්‍යායන් වහන්සේ වූ අපවත් වී වදාළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක ශ්‍රී ආර්යවිලාසවංසාලඞ්කාර සද්ධර්මවාගීශ්වරාචාර්ය පටිපත්තිසෝභන ගණපාමොක්ඛාචරිය මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත අතිපූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන මාහිමිපාණන් වහන්සේට අත්පත් වීමෙන් ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව සැලසේවා!

අපවත් වී වදාළ ප්‍රව්‍රජ්‍යාචාර්ය අතිගරු කිතුලම්පිටියේ ආනන්ද ස්වාමීන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසලය අත්පත් වීමෙන් ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව සැලසේවා!

අපගේ වත්මන් ගෞරවණීය උපාධ්‍යායන් වහන්සේ වන ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ මහෝපාධ්‍යාය, බුත්තල, බුදුගල්ලෙණ අරණ්‍ය සේනාසනාධිවාසි අතිගරු පූජනීය මාවතගම ගුණානන්දාභිධාන මාහිමිපාණන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසල බලයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වේවා! ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව අත්විඳීමට මෙම පින්-පඬුර ද උපනිශ්‍රය වේවා!

මෙබඳු ධර්මග්‍රන්ථ සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ශ්‍රැතමයඥානය දියුණු කර ගැනීම සඳහාත් ගැටලුසු තැන් නිරවුල් කර ගැනීම සඳහාත් මාහට නිතැතින් ම පිහිට වූ ද ශීල - ශ්‍රැත - ප්‍රඥා - චතුර දේශනා විලාසාදි ප්‍රසාදනීය ගුණස්කන්ධයකින් හෙබියා වූ ද ගිලන් ව සිටිමින් පවා ඉතා ඉවසීමෙන් හා කරුණාවෙන් යුතු ව ධර්මය කියා දෙමින් අපගේ දහම් පවස නිවන්නා වූ ද වත්මන් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාධිපති ත්‍රිපිටකාචාර්ය මහාකම්මට්ඨානාචරිය අතිපූජනීය නා උයනේ අරියධම්මාභිධාන මාහිමිපාණන් වහන්සේට මෙම ධර්මදානමය කුසල බලයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් නිදුකින් වැඩසිටීමට ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වේවා! ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව අත්විඳීමට මෙම පින්-පඬුර ද උපනිශ්‍රය වේවා!

අපගේ ආරාධනය පරිදි මෙම ග්‍රන්ථයෙහි අඩුපාඩු තැන් පිරික්සා සාරවත් පෙරවදනකින් ග්‍රන්ථය සැරසූ පොල්ගස්ඕවිට, දික්හේන, විපස්සනා භාවනා මධ්‍යස්ථානයෙහි අනුශාසක පූජනීය මීතලාවේ විනීත ස්වාමීන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසල බලයෙන් ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වේවා! ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව අත්පත් වේවා!

විවිධාකාරයෙන් මාහට උපකාර කරන පොල්ගස්ඕවිට, දික්හේන, භාවනා මධ්‍යස්ථානයෙහි අනුශාසක අතිගරු පූජනීය මීතලාවේ විනීත ස්වාමීන් වහන්සේට ද පූජනීය ශ්‍රීසියේ ඤාණදස්සන ස්වාමීන් වහන්සේට ද දිද්දෙණිය, රණගිරිය අරණ්‍ය සේනාසනාධිවාසි පූජනීය නුවරඑළියේ ඤාණසීල ස්වාමීන් වහන්සේට ද පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසල බලයෙන් ආයුරාරෝග්‍ය සම්පත් හා නිවන් සුව අත්පත් වේවා!

හැදූවැඩූ මවුපිය දෙදෙනා වහන්සේටත් සිවුපසයෙන් උපස්ථාන කරන දයකකාරකාදි සැමටත් විශේෂයෙන් ම මෙම ග්‍රන්ථයේ පරිගණක මුද්‍රණ කටයුතු සිදු කළ පුණ්‍ය ශ්‍රී තුෂන්ත තරුණ උපාසක මහතාටත් උපේක්‍ෂා පියරංගිකා මෙණෙවියටත් මෙම ධර්මදානමය කුසල කර්මයේ බලයෙන් ධර්මඥාන, භාවනාඥාන වර්ධනය කර ගෙන සුව සේ නිවන් සුව අත්විඳීමට ලැබේවා!

මෙම ධර්මදානමය කුසල කර්මය ඉන්ද්‍රෝපේන්ද්‍රාදි දිව්‍යරාජ සමූහයාටත් සදේවකලෝකයාටත් නිර්වාණාවබෝධය පිණිස ම හේතු වාසනා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

**මෙයට,**

**සසුන් ලැදි,**

**පූජ්‍ය නාවල ධම්මානන්ද හිමි.**
**ධම්මාරාම යෝගාශ්‍රමය,**
**උග්ගල්බොඩ,**
**ගම්පහ.**
**(වප් - 2550)**

<u>පටුන</u>


**1.** අසිරිමත් දනය - **10**
**2.** දන ප්‍රභේද හා ප්‍රතිග්‍රාහකයෝ - **11**
**3.** දනයක් මහත්ඵල මහානිසංසදයක වන අයුරු. - **24**
**4.** දනානිසංස - **31**
**5.** දනය ගැන දැන ගත යුතු තවත් කරුණු රැසක් - **35**
**6.** දනයෙන් භාවනාවට - **43**
**7.** දනය සඳහා මුල් වන කුසල් සිත් - **45**
**8.** දනය 'පිනක්' ද? 'කුසලයක්' ද? - **46**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!
භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!

# 1. අසිරිමත් දානය

තුන්ලෝකාග්‍ර වූ අප සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේගේ ශ්‍රාවක, ශ්‍රාවිකාවන් වන සැදැහැති බෞද්ධ පින්වතුන් නිතර සිදු කරන, එමෙන් ම සිදු කිරීමට බෙහෙවින් කැමති පින්කම් අතර 'දානය' මුල් තැනක් ගනී. යමක් පරිත්‍යාග කිරීම, අත්හැරීම 'දානය' යි. දානය පිළිබඳ ව හොඳින් කරුණු වටහා ගත් පින්වත්හු අර්ථවත් ව අවබෝධයෙන් යුතු ව දන් දී බොහෝ පින් සිදු කර ගනිති. බුදුපියාණන් වහන්සේ වදාළ ලෙසින් දානය හා දානානිසංස පිළිබඳ ව කරුණු නො දන්නා පින්වතුන්ට මහත්ඵල මහානිසංස වන ආකාරයට දන් දෙන්නේ කෙසේද'යි කියා අවබෝධයක් නැති අතර එනිසා ම එබඳු පින්වතුන්ට උසස් පිනක් සිදු කර ගැනීමට තිබෙන ඉතා වටිනා අවස්ථාවක් ගිලිහී යන්නේ ය. එමනිසා බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයින් වන භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවු පිරිස ම දන් දීම පිළිබඳ වත් දානානිසංස පිළිබඳ වත් හොඳින් කරුණු දැන සිටිය යුත්තාහ.

දන් දීම වනාහි කවර ආගමකට අනුව ද සාධුසම්මත පුණ්‍යක්‍රියාවකි. අන්‍යාගමිකයන් අතර පවා දන් දීම යහපත් පුණ්‍යක්‍රියාවක් වශයෙන් සම්මත ව පැවතිය ද අන්‍යාගමිකයෙකුට නිවැරදි ව දන් දිය යුතු ආකාරය පිළිබඳ ව හෝ දක්ෂිණක්ෂේත්‍ර පිළිබඳ ව හෝ දායක - ප්‍රතිග්‍රාහක සම්පත්තීන් පිළිබඳ ව හෝ අවබෝධයක් ඇති කර ගන්නට මගක් නැත. බුදුරජාණන් වහන්සේ හැර දන් දීම පිළිබඳ ව නිවැරදි ව දේශනා කිරීමට සමත් වෙනත් ශාස්තෲන් වහන්සේ නමක් ලොව විද්‍යමාන නො වේ. මේ අනුව, දානයක් මහත්ඵල මහානිසංසදායක වන ආකාරයට දෙන්නට ලැබෙන්නේ ද බුද්ධශාසනයක ම බව පැහැදිලි ව පෙනේ. අන්‍ය ආගමික ශාසන ප්‍රතිග්‍රාහකයන්ගෙන් පවා හිස් බව ශ්‍රී සද්ධර්මයට අනුව අභීත ව පැවසිය හැකි ය. දානයක් පිළිගැනීමට සුදුසු උසස් ම ප්‍රතිග්‍රාහකයන් වහන්සේලා වන්නේ බුදු, [පසේබුදු], මහරහත්,

අනාගාමී, සකදාගාමී, සෝතාපන්න යන ආර්යයන් වහන්සේලා ය. මෙම ආර්යයන් වහන්සේලා බුදුසසුනෙන් බැහැර වෙනත් සසුනක විද්‍යමාන නො වේ. ඒ නිසා බාහිර ශාසන අග්‍ර වූ දානයකින් පවා ශූන්‍ය (හිස්) බව පැහැදිලි වේ.

## 2. දාන ප්‍රභේද හා ප්‍රතිග්‍රාහකයෝ

දානය වනාහි,

**1)** ආමිසදාන
**2)** අභයදාන
**3)** ධර්මදාන

වශයෙන් තෙවැදෑරුම් වේ. ආහාරපාන, වස්ත්‍රාදි පසිඳුරන්ට ගෝචර වන දේ දන් දීම ආමිසදානය යි. සතුන් මැරීම ආදි පඤ්ච-දුශ්චරිතවලින් වැළකී අන්‍යයන්ට නිර්භයභාවය දන් දීම අභයදානය යි. එමෙන් ම මරණයට කැප වූ සතුන් මරණ භයින් නිදහස් කරවීම ද අභයදානය යි. කරුණාසිතින් යුතු ව අන්‍යයන්ට ශ්‍රී සද්ධර්මය දේශනා කිරීම, ඉගැන්වීම, දහම් පොතපත පරිත්‍යාග කිරීමාදිය ධර්මදානය යි. (මේ සියලු දානයන් අතර ධර්මදානය ම උතුම් වේ. ශ්‍රේෂ්ඨ වේ. - **සබ්බදානං ධම්මදානං ජිනාති**) මේ අතරින් ආමිසදානයක් සම්පූර්ණ වීමට,

**1)** දායකයා
**2)** ප්‍රතිග්‍රාහකයා
**3)** දාන වස්තුව

යන කරුණු තුන තිබිය යුතු ය. ආමිසදානයක් මහත්ඵල මහානිසංස වීම සඳහා ප්‍රතිග්‍රාහකයාගේ ගුණමහත්වය ද විශේෂයෙන් වැදගත් වේ. මහත්ඵල මහානිසංස විපාක ලැබෙන පරිදි දන් පිළිගැන්වීමට සුදුසු පුණ්‍යක්ෂේත්‍ර පිළිබඳ ඉතා අගනා විවරණයක් මජ්ඣිමනිකායේ උපරිපණ්ණාසකයට අයත් දක්ඛිණාවිභඞ්ග සූත්‍රයෙහි සඳහන් වේ. බුදුරජාණන් වහන්සේ මෙම දේශනාව වදාරන ලද්දේ ශාක්‍ය ජනපදයේ කපිලවස්තු නගරාසන්නයේ පිහිටි නිග්‍රෝධාරාමයෙහි වැඩවාසය කළ අවස්ථාවක දී ය. වරක් මහාප්‍රජාපතී ගෝතමී

දේවිය අලුත් වස්ත්‍ර දෙකක් වියවා ගෙන බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ "ස්වාමීනි, මේ වස්ත්‍ර දෙක භාග්‍යවතුන් වහන්සේ උදෙසා මා විසින් වියා සකස් කරන ලද්දකි. භාග්‍යවතුන් වහන්සේ මා කෙරෙහි අනුකම්පාවෙන් මෙය පිළිගන්නා සේක්වා " යනුවෙන් පවසා සිටියා ය.

මහාප්‍රජාපතී ගෝතමී දේවියට මෙම වස්ත්‍ර පූජා කිරීමේ අදහස පහළ වූයේ බුදුරජාණන් වහන්සේ ප්‍රථම වරට කපිලවස්තු පුරවරයට වැඩම කළ අවස්ථාවේ දී බව මැදුම්සඟි අටුවාවෙහි සඳහන් වේ. ශ්‍රී මහාබෝධිසත්ත්වයන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කළ පසු වසර හත - අටක කාලයකට එතුමන් වහන්සේව ඥාතීන්ට දැක ගන්නට ලැබුණේ නැත. බෝසතාණන් වහන්සේ ඉන් පළමු සය වසර නොයෙක් වනදුර්ග, ගිරිදුර්ගවල හිඳිමින් උග්‍ර තවුස්දම් පුරමින් ගත කළ අතර ඉන්පසු මැදුම් පිළිවෙත අනුගමනය කොට සම්බුද්ධත්වයට පත් ව නොයෙක් ජනපදවල සැරිසරමින් ලෝකයාහට ධර්මදේශනා කරමින් වැඩවාසය කළ සේක. කලකින් තම පුත්‍රරත්නය නො දුටු සුද්ධෝදන රජතුමා කාළුදායි නම් ඇමතිවරයා පිටත් කර යවා ආරාධනා කරවා ගෙන බුදුරජාණන් වහන්සේව සිය පුරවරයට වැඩම කරවා ගත්තේ ය. එම අවස්ථාවේ දී භාග්‍යවතුන් වහන්සේගේ සුළුමෑණියන් වන මහාප්‍රජාපතී ගෝතමී දේවිය මෙසේ සිතන්නී, 'ශ්‍රී මහාබෝසතාණන් වහන්සේ රජමැදුරෙහි ගත කළ කාලයෙහි දී ආහාරපානාදි සියලු අවශ්‍යතා ගැන සොයා බැලුවෙමි, මම ය. දැන් සම්බුද්ධත්වයට පත් ව සිටින මේ අවස්ථාවෙහි දීත් මාගෙන් එම අවශ්‍යතා සම්පූර්ණ විය යුතු ය' යනුවෙන් කල්පනා කළා ය. ඒ අනුව භාග්‍යවතුන් වහන්සේට වස්ත්‍ර දෙකක් පූජා කිරීමට සිතූ එතුමිය කපුනූල් සකස් කොට රෙදි වියන්නන් රජමැදුරට ගෙන්වා ගෙන විශේෂ බත්වැටුප් ආදිය ප්‍රදානය කොට ඉතා සිනිඳු වූත් උසස් වූත් අයුරින් එම වස්ත්‍ර වියවා ගත් අතර රෙදි වියන අවස්ථාවෙහි වියන දණ්ඩ අතින් අල්වා ගෙන එතුමිය ද එයට සහභාගි වූවා ය. මෙලෙස සකස් කර ගත් එම වස්ත්‍ර දෙක ද රැගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණි ඇය තමා කෙරෙහි අනුකම්පාවෙන් එම වස්ත්‍ර පිළිගන්නා ලෙස භාග්‍යවතුන් වහන්සේට ආරාධනා

කළා ය.

එම අවස්ථාවෙහි දී භාග්‍යවතුන් වහන්සේ එතුමියට මෙසේ වදාළ සේක. **“සඞ්ඝේ ගෝතමී දේහි. සඞ්ඝේ තේ දින්නේ අහඤ්චේව පූජිතෝ භවිස්සාමි, සඞ්ඝෝ ච”** එනම්, “ගෝතමියනි, මේ වස්ත්‍ර දෙක මහාසඞ්ඝයාට පූජා කරනු මැනවි. ඔබ විසින් මහාසඞ්ඝයාට මෙම වස්ත්‍ර පූජා කළ කල්හි තථාගතයන් වහන්සේ මෙන් ම මහාසඞ්ඝයා ද පුදන ලද්දේ වෙයි” යනුවෙනි. එහෙත් එයට එක්වර ම සතුටු නො වූ ගෝතමී දේවිය වස්ත්‍ර දෙක තථාගතයන් වහන්සේට ම පිළිගන්නා ලෙස තුන්වන වර දක්වා ම ආරාධනා කළා ය. භාග්‍යවතුන් වහන්සේ ද එම වස්ත්‍ර දෙක මහාසඞ්ඝයාට පූජා කරන ලෙස ගෝතමී දේවියට තුන්වන වර දක්වා ම වදාළ සේක.

ඒ අවස්ථාවෙහි දී ආනන්ද ස්වාමීන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙතින් කාරුණික ඉල්ලීමක් කරමින් “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මේ වස්ත්‍ර දෙක සුගතයන් වහන්සේ ම පිළිගන්නා සේක්වා. මේ මහාප්‍රජාපතී ගෝතමිය භාග්‍යවතුන් වහන්සේගේ සුළුමෑණියෝ ය. මෙතුමිය භාග්‍යවතුන් වහන්සේගේ මෑණියන් කලුරිය කළ පසු තමන්ගේ ම කිරෙන් බෝසතාණන් වහන්සේව පෝෂණය කළා ය. එමෙන් ම ඉතා ආදරයෙන් බෝසතාණන් වහන්සේව හදුවඩා ගත්තා ය. එනිසා භාග්‍යවතුන් වහන්සේට මහාප්‍රජාපතී ගෝතමිය බෙහෙවින් උපකාරී වී ඇත. තව ද මහාප්‍රජාපතී ගෝතමිය භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ බුද්ධරත්නය සරණ ගියා ය. ශ්‍රී සද්ධර්මය සරණ ගියා ය. සඞ්ඝරත්නය සරණ ගියා ය. එමෙන් ම ප්‍රාණඝාතයෙන් වැළකුණා ය. සොරකමින් වැළකුණා ය. කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුණා ය. බොරු කීමෙන් වැළකුණා ය. මත්පැන් පානයෙන් ද වැළකී සිල්වත් උපාසිකාවක් බවට පත් වූවා ය. එමෙන් ම භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණි ගෝතමිය බුද්ධ, ධම්ම, සඞ්ඝ යන තෙරුවන් විෂයෙහි අචල ප්‍රසාදය ඇති කර ගත්තා ය. බුද්ධාදි ආර්ය මහෝත්තමයන් වහන්සේලාගේ ප්‍රසාදය ඇති වනසුලු අරියකන්තසීලය ඇති කර ගත්තා ය. තව ද එතුමිය භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ දුක්ඛ - සමුදය - නිරෝධ - මාර්ග යන

චතුරාර්යසත්‍යය පිළිබඳ ව නිසැකභාවයට පත් වූවා ය. මේ අයුරින් භාග්‍යවතුන් වහන්සේ ද ගෝතමියට බෙහෙවින් උපකාර ය,'' යනුවෙන් පැවසූ සේක. (එහෙත්, මහාප්‍රජාපතී ගෝතමී දේවිය මෙතරම් වෙහෙසී වියා ගත් වස්ත්‍ර දෙක භාග්‍යවතුන් වහන්සේ විසින් නො පිළිගෙන එය මහාසඞ්ඝරත්නයට පූජා කරන ලෙස නියම කිරීමේ හේතුව අට්ඨකථාවන්හි සඳහන් වන්නේ මෙපරිද්දෙනි. එනම්, ප්‍රජාපතී ගෝතමී දේවිය බුදුරජාණන් වහන්සේ අරමුණු කර ගෙන ය, මෙම පින්කම සිදු කිරීමට සූදානම් වූයේ. එනිසා මේ වන විට බුදුරජාණන් වහන්සේ පිදිමේ චේතනා සම්පත්තිය එතුමියට සම්පූර්ණ ව තිබේ. තව දුරටත් එම වස්ත්‍ර මහාසඞ්ඝරත්නය උදෙසා පිදීමෙන් එම කුසලය තවත් වර්ධනය වන්නේ ය. මෙසේ බුදුපියාණන් වහන්සේට මෙන් ම මහාසඞ්ඝරත්නයට ද එම වස්ත්‍ර පිදීමෙන් ගෝතමී දේවියට වඩාත් ආනිසංසදායක කුසලයක් අත්පත් කර දෙනු පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් එම වස්ත්‍ර දෙක පෞද්ගලික ව නො පිළිගන්නා ලදැ'යි යනුවෙන් මැදුම්සඟි අටුවාවෙහි සඳහන් වේ.)

ආනන්ද ස්වාමීන් වහන්සේ විසින් ගෝතමී දේවියගෙන් භාග්‍යවතුන් වහන්සේටත් භාග්‍යවතුන් වහන්සේ වෙතින් ගෝතමී දේවියටත් සිදු වූ උපකාර සඳහන් කළ විට එය අනුමත කරමින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"ආනන්ද, එම කරුණ එසේ ම ය**!** එය එසේ ම ය**!!** යම් පුද්ගලයෙක් තවත් පුද්ගලයකු වෙත පැමිණ බුද්ධ, ධම්ම, සඞ්ඝ යන රත්නත්‍රය සරණ ගියේ ද, ඒ පළමු පුද්ගලයා විසින් දෙවන පුද්ගලයාට වැඳුම් පිදුම් කිරීමෙන් ද සිවුපසයෙන් පිදීමෙන් ද ප්‍රත්‍යුපකාර කිරීම පහසු නො වේ. එමෙන් ම, යම් පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකු වෙත පැමිණ සතුන් මැරීමෙන්, සොරකමින්, කාමයන්හි වරදවා හැසිරීමෙන්, බොරු කීමෙන්, මත්පැන් පානයෙන් වැළකී සිල්වත් බවට පත් වේ ද, ඒ පළමු පුද්ගලයා විසින් දෙවන පුද්ගලයාට වැඳුම් පිදුම් කිරීමෙන් ද සිවුපසයෙන් පිදීමෙන් ද ප්‍රත්‍යුපකාර කිරීම පහසු නො වේ. යම් පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකු වෙත පැමිණ බුද්ධ, ධම්ම, සඞ්ඝ යන රත්නත්‍රය කෙරෙහි අචල ප්‍රසාදය (අවෙච්චප්පසාද) හා

අරියකන්තසීලය ඇති කර ගනී ද එම පළමු පුද්ගලයා විසින් දෙවන පුද්ගලයාට වැඳුම්-පිදුම් කිරීමෙන් ද සිවුපසයෙන් පිදීමෙන් ද ප්‍රත්‍යුපකාර කිරීම පහසු නො වේ. යම් පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකු වෙත පැමිණ දුක පිළිබඳ වත් සසර දුක හටගැනීමේ හේතුව පිළිබඳ වත් දුකෙහි නිරෝධය පිළිබඳ වත් දුක නැති කිරීමේ ප්‍රතිපදව පිළිබඳ වත් නිසැකභාවයට පත් වේ ද එම පළමු පුද්ගලයා විසින් දෙවන පුද්ගලයාට වැඳුම්-පිදුම් කිරීමෙන් ද සිවුපසය පිදීමෙන් ද ප්‍රත්‍යුපකාර කිරීම පහසු නො වේ. (චතුරාර්යසත්‍යය අවබෝධ කර ගැනීම සඳහා සිදු කරන අනුග්‍රහය සුළුපටු නො වන බැවිනි.)"

මෙසේ වදාළ භාග්‍යවතුන් වහන්සේ අනතුරු ව පෞද්ගලික ව පිරිනැමිය හැකි දන තුදුසක් (දහතරක්) වදාළ සේක. එම දන තුදුස නම්;

1) ජීවමාන බුදුරජාණන් වහන්සේට පෞද්ගලික ව පූජා කරන දනය.
2) අබුද්ධෝත්පාද කාලවල දී පසේබුදුවරුන්ට වෙන වෙන ම පූජා කරන දනය.
3) රහතන් වහන්සේලාට පෞද්ගලික ව පූජා කරන දනය.
4) රහත් ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන් උතුමන්ට පෞද්ගලික ව පූජා කරන දනය.
5) අනාගාමී උතුමන්ට පෞද්ගලික ව පූජා කරන දනය.
6) අනාගාමී ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන් උතුමන්ට පෞද්ගලික ව පූජා කරන දනය.
7) සකදගාමී උතුමන්ට පෞද්ගලික ව පූජා කරන දනය.
8) සකදගාමී ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන් උතුමන්ට පෞද්ගලික ව පූජා කරන දනය.
9) සෝතාපන්න උතුමන්ට පෞද්ගලික ව පූජා කරන දනය.
10) සෝතාපත්ති ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන් උතුමන්ට පෞද්ගලික ව පූජා කරන දනය.
11) මේ ශාසනයෙන් බැහැර කාමයන්හි වීතරාගී වූ තපස්වීන්ට දෙන දනය.
12) පෘථග්ජන සිල්වතුන්ට පෞද්ගලික ව දෙන දනය.
13) පෘථග්ජන දුශ්ශීලයන්ට පෞද්ගලික ව දෙන දනය.
14) තිරිසන් සත්ත්වයන්ට දෙන දනය.

මෙම ආකාර තුදුසට **(14)** අනුව පෞද්ගලික දනයන් පිරිනැමීමට ඒ ඒ කාලවල දී හැකියාව තිබේ. අනතුරු ව එම පෞද්ගලික දනයන්හි ආනිසංස වදරන බුදුපියාණන් වහන්සේ,

“ආනන්‍ද, යමෙක් තිරිසන් සත්ත්‍වයන්ට (පිරිසිදු දන චේතනාවෙන්) දන් දෙයි ද ඔහුට සියගුණයක් ආනිසංස ලැබෙන්නේ ය” යනුවෙන් වදාළ සේක. පෘථග්ජන දුශ්ශීලයාට දන් දීමෙන් දහස්ගුණයක් එහි විපාක ලැබෙන බවත් පෘථග්ජන සිල්වතෙකුට දන් දීමෙන් ලක්ෂගුණයක් එහි විපාක ලැබෙන බවත් බුදුසසුනෙන් බාහිර වූ කාමයන්හි වීතරාගී තපස්වීන්ට දන් දීමෙන් කෝටිලක්ෂගුණයක් එහි විපාක ලැබෙන බවත් සෝතාපත්ති ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන් ශ්‍රාවකයෙකුට දන් දීමෙන් අසඞ්ඛෙය්‍ය අප්‍රමෙය්‍ය ගණනින් විපාක ලැබෙන බවත් භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

මෙහි ‘සියගුණයක්’ යන්නට අට්ඨකථාවෙහි අර්ථ දක්වනු ලබන්නේ ආයු - වර්ණ - සැප - බල - පටිභාන (ප්‍රඥා) සියය බැගින් පන්සියයක් ආනිසංස ලැබෙන බව යි. නැතහොත් ආත්මභාව සියයක දී විපාක ලැබෙන බව යි. සෙසු ගුණයන් පිළිබඳ ව ද එනයින් ම සලකා ගත යුතු ය.

තව ද මෙහි සෝතාපත්ති ඵලය සාක්‍ෂාත් කිරීමට පිළිපන් ශ්‍රාවකයා ලෙස අදහස් කෙරෙන්නේ තෙරුවන් සරණ ගිය උපාසකයාගේ පටන් ලෝකෝත්තර මාර්ගස්ථ අවස්ථාවට පත් වීම දක්වා පිළිවෙත් පුරන සියලු ම දෙනා ය. ලෝකෝත්තර මාර්ගය ඒකක්‍ෂණික බැවින් මාර්ගස්ථයාට දන් දෙන්නේ කෙසේ ද යන ගැටලුව මෙහි දී මතු වේ. සෝතාපන්න වීම සඳහා විදර්ශනා වඩමින් සිටින යෝගාවචරයෙකුට දන් දීමට සූදානම් වන දයකයෙකු විසින් එම යෝගාවචරයා ලෝකෝත්තර මාර්ගයට පත් වන (මග්ගවුට්ඨාන) ක්‍ෂණයෙහි දනවස්තුව ඔහු අතට පත් කරන ලද්දේ නම් මාර්ගස්ථයාට දන් දුන්නා වන්නේ ය. ලෝකෝත්තර මාර්ගයට පත් වූයේ යම් ඉරියවුවකින් ද එම ඉරියවුව වෙනස් නො කර සිටිනතාක් මාර්ගස්ථයා ලෙස ම සැලකිය හැකි බව ද තවත් ආචාර්ය මතයකි. එනිසා තිසරණගත උපාසකයාගේ පටන් සෝතාපන්න (ලෝකෝත්තර) මාර්ගස්ථ ශ්‍රාවකයා දක්වා සියලුදෙනා සෝතාපත්ති ඵලය සාක්‍ෂාත් කිරීමට පිළිපන් ශ්‍රාවකයෝ ය. ඵලයට පත් වූ ක්‍ෂණයෙහි පටන් ඵලස්ථ ශ්‍රාවකයා ය.

"සෝතාපත්ති ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන් ශ්‍රාවකයාට දන් දීමෙන් අසඞ්ඛෙය්‍ය අප්‍රමෙය්‍ය ආනිසංස ලැබේ නම් සෝතාපන්න - සකදාගාමී - අනාගාමී - අර්හත් ශ්‍රාවකයන් වහන්සේලාටත් පසේබුදු - සම්මාසම්බුදු මහෝත්තමයන් වහන්සේලාටත් දන් දීමෙන් ලැබෙන ආනිසංස ගැන කවර කථාවක් ද?" යනුවෙන් තව දුරටත් වදාළ බුදුපියාණන් වහන්සේ අනතුරු ව සඞ්ඝගත දක්ෂිණා හතක් පිළිබඳ ව දේශනා කළ සේක.

1) **බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ ව භික්ෂු, භික්ෂුණී උභය සඞ්ඝයාට (ප්‍රමාණ නො කොට) දෙන දානය**
2) **බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ පසු භික්ෂු, භික්ෂුණී උභය සඞ්ඝයාට (ප්‍රමාණ නො කොට) දෙන දානය**
3) **භික්ෂුසඞ්ඝයාට පමණක් (ප්‍රමාණ නො කොට) දෙන දානය**
4) **භික්ෂුණීසඞ්ඝයාට පමණක් (ප්‍රමාණ නො කොට) දෙන දානය**
5) **'සඞ්ඝයාගෙන් මෙපමණ භික්ෂූන් වහන්සේලා ද මෙපමණ භික්ෂුණීන් වහන්සේලා ද දානය පිළිගනිත්වා' යනුවෙන් ගණන ප්‍රමාණ කොට දෙන දානය (උදාහරණයක් ලෙස මහාසඞ්ඝයාගෙන් භික්ෂූන් වහන්සේලා දසනමක් හා භික්ෂුණීන් වහන්සේලා දසනමක් යනාදි වශයෙනි. එනිසා සඞ්ඝගත දාන සඳහා ආරාධනා කරන විට 'මහාසඞ්ඝයාගෙන් [සඞ්ඝතෝ] මෙපමණ භික්ෂූන් වහන්සේලා හා භික්ෂුණීන් වහන්සේලා දානය පිළිගනිත්වා' යනුවෙන් නිවැරදි ලෙස ආරාධනා කිරීමට දායක පින්වතුන් මතක තබා ගත යුතු ය.)**
6) **'මහාසඞ්ඝයාගෙන් මෙපමණ භික්ෂූන් වහන්සේලා දානය පිළිගනිත්වා' යනුවෙන් (භික්ෂූන්ගේ) ගණන ප්‍රමාණ කොට දෙන දානය**
7) **'මහාසඞ්ඝයාගෙන් මෙපමණ භික්ෂුණීන් වහන්සේලා දානය පිළිගනිත්වා' යනුවෙන් (භික්ෂුණීන්ගේ) ගණන ප්‍රමාණ කොට දෙන දානය**

සඞ්ඝගත දක්ෂිණා හත පිළිබඳ ව වදාළ බුදුරජාණන් වහන්සේ අනතුරු ව අනාගත කාලයෙහි, නමින් පමණක් ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන් වශයෙන් පෙනී සිටින කාසාවකණ්ඨකයන් බිහි වන බවත් ඔවුන් විෂයෙහි වුව ද මහාසඞ්ඝරත්නය උදෙසා දෙන දානය මහත්ඵල මහානිසංසදායක වන බවත් ආනන්ද ස්වාමීන් වහන්සේට වදාළ සේක. මෙහි සඳහන් කාසාවකණ්ඨකයෝ යනු කවරහු දැ'යි කියා මැදුම්සඟි අටුවාව මෙසේ විවරණය කරයි. අනාගත කාලයෙහි භික්ෂූහු

ප්‍රතිපත්තියෙන් පිරිහී ගොස් ගොවිතැන් - වෙළඳාම් කිරීම් ආදියෙන් ජීවත් වන විවාහ වී අඹුදරුවන් සහිත ව වෙසෙන ශ්‍රමණ පිරිසක් බවට පත් වන්නාහ. සිවුරු දැරීමක් නො කරන ඔවුහු ශ්‍රමණයන් බව හඳුනා ගැනීම සඳහා අතෙහි හෝ ගෙලෙහි හෝ කහ පැහැති රෙදි කැබැල්ලක් බැඳ සිටින්නාහ. මොවුහු ශ්‍රමණධර්ම නැති පිරිසක් වුව ද මහසඟ පරපුරෙන් අවිච්ඡින්න ව පැවත ගෙන එන පිරිසකි. මෙබඳු පිරිසක් විෂයෙහි පවා ආර්ය-මහාසඞ්ඝරත්නය අරමුණු කර ගෙන දෙන දනය පෞද්ගලික ව දෙන දනයකට වඩා මහත්ඵල මහානිසංසදයක වේ. මෙහි දී මහාසඞ්ඝරත්නය අරමුණු කර ගෙන කාසාවකණ්ඨකයන් උදෙසා දෙන දනය මහත්ඵල - මහානිසංසදයක වනුයේ කාසාවකණ්ඨකයන් නිසා නොව, සාරිපුත්ත - මොග්ගල්ලාන ආදි මහරහතන් වහන්සේලා නිසා ය. මහාසඞ්ඝරත්නය පරාමර්ශනය කොට දන් දෙන කල්හි එම දනය විශුද්ධ වන්නේ ආර්ය-මහාසඞ්ඝරත්නය නිසා ය.

තව ද ඒ ඒ කාලවල දී දෙනු ලබන පෞද්ගලික දන සැසඳිය යුත්තේ ඒ ඒ කාලවල සඞ්ඝගත දක්ෂිණාවන් සමග බව අට්ඨකථාව අනුව පෙනේ. උදහරණයක් ලෙස බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයෙහි දී බුදුරජාණන් වහන්සේට පෞද්ගලික ව පූජා කරන දනයට වඩා බුදුරජුන් ප්‍රමුඛ මහාසඞ්ඝරත්නයට පූජා කරන දනය මහත්ඵල-මහානිසංසදයක වේ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ පසු බුදුරජාණන් වහන්සේ වෙනුවට සධාතුක බුද්ධප්‍රතිමා වහන්සේනමක් තැන්පත් කොට බුදුරජුන් ප්‍රමුඛ මහාසඞ්ඝරත්නයට දන් දිය හැකි බව අට්ඨකථාවෙහි සඳහන් වේ. දුශ්ශීල භික්ෂුවකට වුව ද මහාසඞ්ඝරත්නයට කෙරෙන සියලු ගෞරව දක්වා මහාසඞ්ඝරත්නය උදෙසා පහන් සිතින් ම එම දුශ්ශීල භික්ෂුවට දන් දෙන පින්වතෙකුට සිල්වත් මහාසඞ්ඝරත්නය උදෙසා දන් දීමේ ආනිසංස අඩුවක් නැති ව ම ලබා ගත හැකි බව අට්ඨකථාවෙහි තව දුරටත් සඳහන් වේ.

භාග්‍යවතුන් වහන්සේ, මහාප්‍රජාපතී ගෝතමී දේවියගේ චීවර පූජාව තමන් වහන්සේ පිළි නො ගෙන එය මහාසඞ්ඝරත්නයට පූජා කරන ලෙස වදළේ මෙපරිද්දෙන්

බුදුරජුන් මෙන් ම සඞ්ඝරත්නය ද පිදීමෙන් එතුමියට වඩාත් උසස් ආනිසංස හිමි කර දීම සඳහා ය. එනිසා දන් දෙන පින්වතුන්ට මෙය වටිනා උපදේශයකි. ඒ ඒ භික්ෂූන්ගේ පෞද්ගලික දුශ්ශීලභාවයන් නො සලකා ආර්ය මහාසඞ්ඝරත්නය අරමුණු කර ගෙන බලවත් පහන් සිතින් දන් දීමෙන් මහත්ඵල - මහානිසංසදායක විපාක ලබා ගත හැකි වන්නේ ය.

ඉහත සඳහන් සඞ්ඝගත දක්ෂිණාවන් අතරින් වර්තමානයෙහි පහසුවෙන් දිය හැකි වන්නේ තුන්වැනි දානය වන ගණන ප්‍රමාණ කිරීමක් නැති ව භික්ෂුසඞ්ඝයාට දෙන දානය හා සයවැනි දානය වන ගණන ප්‍රමාණ කොට භික්ෂුසඞ්ඝයාට දෙන දානයත් ය. අනුරාධපුර යුගයෙන් පසු ලක්දිව භික්ෂුණීසඞ්ඝයා විසූ බවක් අසන්නට නැති අතර වර්තමානයෙහි ලෝකයේ කිසිම රටක ථේරවාදි භික්ෂුණීන් වහන්සේලා නැත. දැනට බෞද්ධ භික්ෂුණීන් නමින් ඇතැම් රටවල වාසය කරන්නේ මහායාන භික්ෂුණීහු ය. මහායානය වනාහි මූලික බුදුදහම (ධර්ම-විනය) වෙනස් කර ගැනීමෙන් පසු ව ඇති කර ගන්නා ලද නව බෞද්ධ සම්ප්‍රදායකි. එනිසා මහායාන භික්ෂූන් හා භික්ෂුණීන් සාරිපුත්ත - මොග්ගල්ලානාදි මහරහතන් වහන්සේලාගෙන් පැවතෙන භික්ෂු පරපුරට හෝ මහාප්‍රජාපතී ගෝතමී තෙරණියගෙන් පැවතෙන භික්ෂුණී පරපුරට අයත් සේ සැලකිය නො හැකි බව පෙනේ.

අනතුරු ව භාග්‍යවතුන් වහන්සේ දානයක් මහත්ඵල - මහානිසංසදායක වන ආකාර (දක්ඛිණාවිසුද්ධි) හතරක් වදාළ සේක.

1) **දායකයාගේ පාර්ශ්වයෙන් (පැත්තෙන්) පමණක් විශුද්ධියට (වඩාත් ආනිසංසදායක බවට) පත් වන දානයක් ඇත. එම දානය ප්‍රතිග්‍රාහකයාගේ පාර්ශ්වයෙන් ආනිසංසදායක නො වේ.**
2) **ප්‍රතිග්‍රාහකයාගේ පාර්ශ්වයෙන් පමණක් විශුද්ධියට පත් වන දානයක් ඇත. එම දානය දායකයා නිසා විශුද්ධියට පත් නො වේ.**
3) **ප්‍රතිග්‍රාහකයා නිසා හෝ දායකයා නිසා හෝ විශුද්ධියට පත් නො වන දානයක් ද තිබේ.**
4) **දායකයා නිසාත් ප්‍රතිග්‍රාහකයා නිසාත් විශුද්ධියට පත් වන දාන තිබේ. එම දාන විශේෂයෙන් ම ආනිසංසදායක ය.**

මෙය තව දුරටත් විස්තර කොට වදාළ භාග්‍යවතුන් වහන්සේ සිල්වත් වූ කල්‍යාණ-ධර්ම ඇති දයකයෙකු දුශ්ශීල ප්‍රතිග්‍රාහකයෙකුට දන් දීමේ දී එම දානය වඩාත් ආනිසංසදායක වන්නේ දයකයාගේ පුණ්‍ය බලය නිසා බවත් දුශ්ශීල දයකයෙකු සිල්වත් කල්‍යාණ-ධර්ම ඇති ප්‍රතිග්‍රාහකයන් වහන්සේනමකට දන් දීමේ දී එම දානය වඩාත් ආනිසංසදායක වන්නේ ප්‍රතිග්‍රාහකයන් වහන්සේගේ ගුණ සම්පත්තිය නිසා බවත් දෙදෙනා ම දුශ්ශීල නම් එම දානය එතරම් ආනිසංසදායක නො වන බවත් දයක - ප්‍රතිග්‍රාහක දෙදෙනා ම සිල්වත් කල්‍යාණ-ධර්ම ඇති අය නම් එම දානය දෙපසින් ම ආනිසංසදායක බවත් වදාළ සේක. මෙහි දී රහතන් වහන්සේනමක් රහතන් වහන්සේනමකට දෙන දානය ම දාන අතරින් උත්කෘෂ්ට දානය වෙයි. තව ද සාරිපුත්ත මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේට පූජා කරන දානයට වඩා බුදුරජාණන් වහන්සේ සාරිපුත්ත මහරහතන් වහන්සේට පූජා කරන දානය ම වඩාත් ආනිසංසදායක බව මැදුම්සඟි අටුවාවෙහි සඳහන් වේ. එයට හේතුව නම්, දානානිසංස පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ තරම් අවබෝධ කර ගත් වෙනත් උතුමෙකු නොමැති වීම ය' යි එහි තව දුරටත් දැක්වේ. මෙබඳු ආනිසංසදායක දානමය පුණ්‍යකර්මයක් මේ බුදුසසුනින් පිටත නො ලැබේ ම ය. එනිසා අන්‍ය ආගම් මෙබඳු ආනිසංසදායක දානයෙන් ද හිස් බව එයින් පැහැදිලි වේ. එසේ කල්හි, අන්‍ය ශාසනවල නිවන සාක්ෂාත් කරන ප්‍රතිපදාවක් නැති බව කියනු ම කවරේ ද? එනිසා දන් දෙන සත්පුරුෂ පින්වත්හු මෙම කරුණු වටහා ගෙන මනා අවබෝධයෙන් යුතු ව ම දන් දීමට වෑයම් කළ යුත්තාහ.

තව ද, ප්‍රතිග්‍රාහකයන් අනුව,

**1)** පූජා-බුද්ධියෙන් දෙන දානය

**2)** අනුග්‍රහ-බුද්ධියෙන් දෙන දානය,

වශයෙන් දානය දෙයාකාර වේ. වැඩි ආනිසංසයක් ලබා නුදුන්නත් දුගී, මගී, යාචකාදි අනුකම්පා කටයුතු පුද්ගලයන්ට ද දන් දිය යුතු ය. ඔවුන් කෙරෙහි කාරුණික වීම් වශයෙනි, එසේ කළ යුත්තේ. එය අනුග්‍රහ-බුද්ධියෙන් දෙන

දානය යි. යමක් ලැබීමට සෑම විටක ම සුදුසුකම වන්නේ නැතිබැරිකම නො වේ. දන් ලැබීමට සැබෑ ම සුදුසුකම වන්නේ ගුණවත් බව යි. ගුණවත් බව සලකා පිදිය යුතු උතුමන් විෂයෙහි දන් දීම පූජා-බුද්ධියෙන් දෙන දානය යි. පිරිසක්-සමූහයක් වශයෙන් සලකන කල්හි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝරත්නය තරම් දක්ෂිණාවන් ලැබීමට සුදුසු අනෙක් පිරිසක් ලොව නැත. ඒ බව භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් ම පැහැදිලි කර ඇති අයුරු මෙසේ ය.

1. **සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො** - භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක පිරිස නිවන සාක්ෂාත් කරන නිවැරදි ප්‍රතිපදාවෙන් යුක්ත ය.
2. **උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො** - භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක පිරිස නිවන සාක්ෂාත් කරන ඍජු ප්‍රතිපදාව වන ආර්ය-අෂ්ටාඞ්ගික මාර්ගය අනුගමනය කරති.
3. **ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො** - භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක පිරිස (චතුරාර්යසත්‍යය අවබෝධ කරමින්) නිවන සාක්ෂාත් කිරීම පිණිස ම යොමු වූ පිරිසකි.
4. **සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො** - භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක පිරිස වැඳුම්, පිදුම්, ගරු බුහුමන් ලැබීමට සුදුසු පිරිසකි.

සෝතාපන්න, සකදාගාමී, අනාගාමී, අර්හත් යනුවෙන් යුගල වශයෙන් සතරක් ද සෝතාපන්න මාර්ගස්ථ - ඵලස්ථ, සකදාගාමී මාර්ගස්ථ - ඵලස්ථ, අනාගාමී මාර්ගස්ථ - ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ - ඵලස්ථ යන පුද්ගලයන්ගේ වශයෙන් අටනමක් ද වූ ආර්ය සඞ්ඝරත්නය,

5. **ආහුනෙය්‍යො** - දුර බැහැර සිට ගෙනවුත් පුදන පුදසත්කාර ලැබීමට සුදුසු ය.
6. **පාහුනෙය්‍යො** - ආගන්තුකයන් වෙනුවෙන් සැකසූ සියලු සංග්‍රහයන්ගෙන් පිදුම් ලැබීමට සුදුසු ය.
7. **දක්ඛිණෙය්‍යො** - පරලොව දී ලැබෙන පින්ඵල අදහා දෙන සියලු දන් පිළිගැනීමට සුදුසු ය.
8. **අඤ්ජලිකරණීයො** - දෙහොත් මුදුන් දී නමස්කාර කිරීමට සුදුසු ය.

**9. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස** - ලෝකයාට අනුත්තර වූ පුණ්‍යක්ෂේත්‍රයකි.

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝරත්නය හැර මෙම ගුණයන්ගෙන් යුක්ත වන වෙනත් පැවිදි පිරිසක් ලොව නැති බැවින් ප්‍රතිග්‍රාහක පක්ෂය වශයෙන් (බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ) ආර්ය මහාසඞ්ඝරත්නය ම ලොව අග්‍ර වේ.

මහාසඞ්ඝරත්නය අරමුණු කර ගෙන දන් දෙන විට දනයට සහභාගි වන භික්ෂූන් වහන්සේලාගේ උස්මිටිකම් නො සෙවිය යුතු ය. සහභාගි වන පිරිසේ අඩුපාඩු සැලකීමෙන් සඟසතු දනයක අනුසස් නො ලැබී යයි. ඒ පිළිබඳ ව අඞ්ගුත්තරනිකායේ ඡක්කනිපාතයේ දරුකම්මික සූත්‍රයෙහි මෙසේ සඳහන් වේ. වරක් භාග්‍යවතුන් වහන්සේ නාදිකාවෙහි ගඩොලින් කළ ආවාසයෙහි වැඩවසන කලෙක දරුකම්මික නම් ගෘහපතිතුමා භාග්‍යවතුන් වහන්සේ හමුවීමට පැමිණියේ ය. ඔහු භාග්‍යවතුන් වහන්සේට ගෞරව දක්වා පසෙකින් අසුන් ගත් පසු භාග්‍යවතුන් වහන්සේ ඔහුගෙන් මෙසේ විමසූ සේක.

**බුදුරජු:** "ගෘහපතිතුමනි, ඔබගේ නිවසෙහි දන් දෙනු ලැබේ ද?"

**ගෘහපති:** "එසේ ය, ස්වාමීනි, අපගේ නිවසෙහි දන් දෙනු ලැබේ. එහෙත් දන් දෙනු ලබන්නේ අරණ්‍යවාසි - පාංශුකූලික - පිණ්ඩපාතික භික්ෂූන් වහන්සේලාටත් රහතන් වහන්සේලාට හා රහත් මගට පිළිපන් උතුමන්ටත් ය."

**බුදුරජු:** "ගෘහපතිතුමනි, අඹුදරුවන් සහිත ව වාසය කරමින්, මල්, සුවඳ විලවුන් ආදිය දරමින්, රන්, රිදී, මිලමුදල් පරිහරණය කරමින් ගිහි ජීවිතයක් ගත කරන ඔබට 'මේ රහතන් වහන්සේලා ය, මේ රහත් මගට පිළිපන් උතුමෝ ය' යනුවෙන් හඳුනා ගැනීම පහසු නො වේ."

"ගෘහපතිතුමනි, යම් භික්ෂුවක් අරණ්‍යයක වෙසෙමින්

චපල ව, මානයෙන් යුතු ව, නො සන්සුන් සිතින්, මුඛරි ව, සිහි මුළාවෙන් වෙසේ ද, ඒ භික්ෂුව ඒ කරුණින් ගර්හාවට ලක් වේ. එසේ ම, යම් භික්ෂුවක් ගමෙහි වෙසෙමින් හෝ පිණ්ඩපාතයෙන් ජීවත් වෙමින් හෝ දන සඳහා ආරාධනා පිළිගනිමින් හෝ පාංශුකූල සිවුරු පොරවමින් හෝ ගෘහපතියන් පූජා කරන සිවුරු පොරවමින් හෝ චපල ව, මානයෙන් යුතු ව, නො සන්සුන් සිතින්, මුඛරි ව සිහි මුළාවෙන් වෙසේ ද ඒ භික්ෂුව ඒ කරුණින් ගර්හාවට ලක් වේ.

තව ද යම් භික්ෂුවක් අරණ්‍යයක වෙසෙමින් හෝ ගමෙහි වෙසෙමින් හෝ පිණ්ඩපාතයෙන් ජීවත් වෙමින් හෝ දන සඳහා ආරාධනා පිළිගනිමින් හෝ පාංශුකූල සිවුරු පොරවමින් හෝ ගෘහපතියන් පූජා කරන සිවුරු පොරවමින් හෝ චපල නො වී, මුඛරි නො වී, මානය දුරු කොට, සන්සුන් සිතින් යුතු ව, දමුනු ඉඳුරන් ඇති ව, සිහි-නුවණින් වෙසේ ද, ඒ භික්ෂුව ඒ කරුණින් ප්‍රශංසාවට ලක් වේ.

ඒ නිසා ගෘහපතිතුමනි, ඔබ සඞ්ඝරත්නය උදෙසා දන් දෙන්නේ මැනවි. එවිට ඔබේ සිත පහන් වන්නේ ය. පහන් සිතින් කලුරිය කොට ඔබ සුගතියෙහි උපදින්නෙහි ය.''

**ගෘහපති:** ''එසේ ය, ස්වාමීනි, මම අද පටන් සඞ්ඝරත්නය උදෙසා දන් දෙන්නෙමි''

මෙලෙස ඒ උතුම් බුද්ධාවවාදය දරුකම්මික ගෘහපතිතුමා විසින් ගෞරවයෙන් පිළිගන්නා ලදී. ඒ අනුව සඞ්ඝරත්නය උදෙසා දන් දෙන කල්හි ඒ ඒ භික්ෂූන්ගේ අඩුපාඩු හෝ විශේෂතා හෝ සිහි නො කොට මහරහතන් වහන්සේලා පිරිසකට දන් දෙන්නේ ය' යි සිතා පහන් සිතින් ම දන් දීම කළ යුතු ය. <u>මහාසඞ්ඝරත්නය උදෙසා දන් දීමේ දී</u> භික්ෂූන් වහන්සේලා වැඩසිටින සෙනසුන හෝ පොරවන සිවුරේ වර්ණය හෝ දරන තනතුරු, පදවි ආදිය හෝ වැදගත් නො වන බව මෙම දරුකම්මික සූත්‍රයෙන් පැහැදිලි වේ.

## 3. දනයක් මහත්ඵල මහානිසංසදයක වන අයුරු.

මහත්ඵල-මහානිසංසදයක විපාක ගෙන දෙන ආකාරයට දනයක් දීමේ දී සම්පූර්ණ විය යුතු අංග හයක් පිළිබඳ ව අඞ්ගුත්තර - ඡක්කනිපාතයේ 'ඡළඞ්ගදන' සූත්‍රයෙහි සඳහන් වේ. බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සමයක වේළුකණ්ටකී නන්දමාතාව සාරිපුත්ත, මොග්ගල්ලාන මහරහතන් වහන්සේලා ප්‍රමුඛ මහාසඞ්ඝරත්නයට දුන් දනයක් අරමුණු කර ගෙන ය, එම දේශනා ව වදරන්නට යෙදුණේ.

අනාගාමී මහෝපාසිකාවක් වන වේළුකණ්ටකී නන්දමාතාව දිනක්, සාරිපුත්ත - මොග්ගල්ලාන මහරහතන් වහන්සේලා ප්‍රමුඛ මහාසඞ්ඝරත්නයට දන් පිරිනමා මහත් වූ පිනක් සිදු කර ගත්තා ය. නන්දමාතාව මෙසේ දන් දෙනු දිවැසින් දුටු භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, වේළුකණ්ටකී නන්දමාතා උපාසිකාව සාරිපුත්ත - මොග්ගල්ලාන අග්‍රශ්‍රාවකයන් වහන්සේලා ප්‍රමුඛ මහාසඞ්ඝරත්නයට අංග හයකින් යුතු මහාදනයක් පූජා කරන්නී ය. අංග හයකින් යුතු එම දක්ෂිණාව (ඡළඞ්ගසමන්නාගතා දක්ඛිණා) කවරක් ද? එහි දී දයක පක්ෂයෙන් අංග තුනක් ද ප්‍රතිග්‍රාහක පක්ෂයෙන් අංග තුනක් ද සමන්විත විය යුතු යි. දයක පක්ෂයෙන් සම්පූර්ණ විය යුතු අංග තුන කවරේ ද?"

1) දයකයා දන් දීමට පෙර ම පවිත්‍ර වූ යහපත් සිතින් යුතු වෙයි. **(පුබ්බේව දනා සුමනෝ)**
2) දන් දෙමින් ද සිත පහන් කර ගනී. **(දදං චිත්තං පසාදේති)**
3) දන් දීමෙන් පසු ඒ පිළිබඳ ව සතුටු වෙයි. **(දත්වා අත්තමනෝ හෝති)**

"මහණෙනි, ප්‍රතිග්‍රාහක පක්ෂයෙන් සම්පූර්ණ විය යුතු අංග තුන කවරේ ද?"

ප්‍රතිග්‍රාහකයන් වහන්සේලා,

1) රාගය දුරු කළ හෝ රාගය දුරු කිරීම සඳහා පිළිපන් උතුමෝ වෙත් ද,
2) ද්වේෂය දුරු කළ හෝ ද්වේෂය දුරු කිරීම සඳහා පිළිපන් උතුමෝ වෙත් ද,
3) මෝහය දුරු කළ හෝ මෝහය දුරු කිරීම සඳහා පිළිපන් උතුමෝ වෙත් ද,

මේ ප්‍රතිග්‍රාහක පක්ෂයෙන් සම්පූර්ණ විය යුතු අංග තුන යි.

"මහණෙනි, අංග සයකින් යුතු දක්ෂිණාව නම් මෙය යි. අංග සයකින් යුතු මෙම දක්ෂිණාවෙන් ලැබෙන පුණ්‍යස්කන්ධය මෙපමණ වූ පුණ්‍යගඞ්ගාවක් ය'යි කියා ද යහපත් වූ මනවඩන සුගතිගාමී වන සැප විපාක ගෙන දෙන ආනිසංස මෙපමණක් ය'යි කියා ද ප්‍රමාණය දැක්විය නො හැක. මෙම අංග සයෙන් යුතු දානය, ප්‍රමාණ කළ නො හැකි (අසඞ්ඛෙය්‍ය - අප්පමෙය්‍ය) ආනිසංස ගෙන දෙන දානයකි."

"මහණෙනි, මහාසාගරයෙහි ජලකඳ දිය නැළිවලින් මැන මෙපමණ නැළි ගණනක් ය'යි දැක්විය නො හැක්කේ යම් සේ ද, මහාසාගරයෙහි ජලකඳ අසඞ්ඛෙය්‍ය, අප්‍රමෙය්‍ය ගණනට අයත් වන්නේ යම් සේ ද මහණෙනි, මෙම අංග හයෙන් යුතු දානය ද එබඳු ම වූ අසඞ්ඛෙය්‍ය, අප්‍රමෙය්‍ය ආනිසංස ඇතියකි" යි යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

මෙම දානානිසංස දේශනාවෙහි සඳහන් පරිදි දන් දීමට පූර්වයෙන් ද දන් දෙන අවස්ථාවෙහි ද දන් දීමෙන් පසු ව ද සිත පහදවා ගැනීමට (එනම්, තුන් සිත පහදවා ගෙන දන් දීමට) දායක පින්වතුන් සමත්වෙතොත් එය දායක පක්ෂයෙන් දානය මහත්ඵල කර ගැනීමට හේතු වන කරුණක් බව විශේෂයෙන් සැලකිය යුතු ය. දන් දෙන අවස්ථාවෙහි දී සිත පහදවා ගෙන, දන් දීමෙන් පසු ව සිත කිලිටි කර ගැනීමෙන් විපාක ශක්තිය පිරිහී යන අයුරු සංයුත්තනිකායේ-කෝසලසංයුත්තයෙහි සඳහන් වන අපුත්‍රක-සිටුවරයාගේ කථාවස්තුවෙන් දත හැකි ය. එනිසා කිසිවිටෙකත් තමන් දන්

දුන් කිසිවක් පිළිබඳ ව විපිළිසර සිත් ඇති කර නො ගැනීමට දයක පින්වත්හු සැලකිලිමත් වෙත්වා!

අඞ්ගුත්තරනිකායේ සත්තකනිපාතයට අයත් ‘දනමහප්ඵල’ සූත්‍රයෙහි ද දනයක් මහත්ඵල - මහානිසංසදයක වීමට හේතු වන තවත් කරුණු රැසක් සඳහන් වී තිබේ. භාග්‍යවතුන් වහන්සේ චම්පා නුවර ගග්ගරා නම් පොකුණු තෙර වැඩවාසය කරන අවස්ථාවක දී චම්පා නුවර උපාසකවරු සාරිපුත්ත මහරහතන් වහන්සේ වෙත පැමිණ “ස්වාමීනි, අපට භාග්‍යවතුන් වහන්සේ වෙතින් ධර්මදේශනාවක් අසන්නට ලැබුණේ බොහෝ කලකට පෙර ය. එනිසා අපහට භාග්‍යවතුන් වහන්සේ වෙතින් ධර්මය අසන්නට අවකාශ සලසා දෙන සේක්වා” යි කියා ඉල්ලා සිටියහ. “එසේ නම්, උපාසකවරුනි, ඔබලා පොහෝ-දින පැමිණෙන්නැ” යි කියා සාරිපුත්ත තෙරණුවෝ පිළිතුරු දුන්හ. ඒ අනුව උපාසක පිරිස, පොහෝ දින එළැඹි කල්හි දහම් අසන රිසියෙන් යළි එහි පැමිණියහ. පිරිස බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ගෞරව දක්වා පසෙකින් හුන් කල්හි සාරිපුත්ත තෙරණුවෝ ඔවුන් වෙනුවෙන් මෙම ප්‍රශ්නය භාග්‍යවතුන් වහන්සේ වෙත යොමු කළහ.

**සැරියුත් තෙරණුවෝ:** “ස්වාමීනි, ඇතැම් කෙනෙක් දෙන දනය මහත්ඵල - මහානිසංසදයක වේ. ඇතැම් කෙනෙක් දෙන දනය මහත්ඵල - මහානිසංසදයක නො වේ. දන සම්බන්ධයෙන් මෙබඳු අයුරක් තිබෙනවා නො වේ ද?

**බුදුරජු:** “සාරිපුත්ත, ඇතැම් කෙනෙක් දෙන දනය මහත්ඵල - මහානිසංසදයක වන අතර ඇතැම් කෙනෙක් දෙන දනය මහත්ඵල - මහානිසංසදයක නො වේ. මෙබඳු අයුරක් ඇත්තේ ම ය.

**සැරියුත් තෙරණුවෝ:** “ස්වාමීනි, එසේ වීමට හේතුව කුමක් ද?”

**බුදුරජු:** “සාරිපුත්ත, ඇතැම් කෙනෙක් අපේක්ෂා සහිත ව, දනයේ විපාක පරලොව දී භුක්තිවිඳින අදහසින් යුතු ව, දනයෙහි විපාකයට ආශාවෙන් බැඳී සිටිමින් පැවිදි

උතුමන්ට ආහාර පානාදිය දන් දෙති. සාරිපුත්ත, ඇතැම් කෙනෙක් මෙසේ දන් දෙනවා නො වේ ද?

**සැරියුත් තෙරණුවෝ:** "එසේ ය, ස්වාමීනි,"

**බුදුරජු:** "එසේ දන් දී ඒ පින් බලයෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන් අතර ඔහු උපදින්නට පුළුවනි. එහෙත් එම විපාකය අවසන් වීමෙන් ඔහුට යළි මිනිස්ලොවට පැමිණීමට සිදු වේ." (එම දානය සසර දී සැප විපාක ලබා දෙන දානයක් පමණි. නිවන පිණිස සෘජු ව ම හේතු නො වේ. එනිසා මහත්ඵල මහානිසංසදායක නො වේ.)

මෙම අරමුණුවලින් යුතු ව දෙන දානවල විපාක සසර සැප සඳහා ම හේතු වේ. නිවන පිණිස සෘජු ව හේතු නො වේ.

**2)** "සාරිපුත්ත, මෙහි ඇතැම් කෙනෙක් 'දන් දීම හොඳ ය'යි සලකා දන් දෙති " .....

**3)** "සාරිපුත්ත, මෙහි ඇතැම් කෙනෙක් 'අපගේ පියවරු ද මුතුන්මිත්තෝ ද දන් දුන්හ. එම කුලසිරිත නො කඩ කොට මා විසින් ද දන් දිය යුතු ය'යි සලකා දන් දෙති " .....

**4)** "සාරිපුත්ත, මෙහි ඇතැම් කෙනෙක් 'ශ්‍රමණයන් වහන්සේලා වනාහි ආහාර නො පිසති. අප වනාහි ආහාර පිසන බැවින් ආහාර නො පිසන ශ්‍රමණයන් වහන්සේලාට දන් නො දී සිටීම සුදුසු නො වේ ය'යි සිතා දන් දෙති." .....

**5)** "සාරිපුත්ත, මෙහි ඇතැම් කෙනෙක් 'පුරාණයේ සිටි අට්ඨක, වාමක, වාමදේව, වෙස්සාමිත්ත ආදි පුරාණ ඍෂිවරු මහායාග (මහාදාන) දුන්හ. මාගේ දානය ද ඒ ගණයට අයත් වීම සඳහා මා විසින් ද දන් දිය යුතු ය'යි සිතා දන් දෙති " .....

**6)** "සාරිපුත්ත, මෙහි ඇතැම් කෙනෙක් දන් දෙන විට සිතෙහි ඇති වන පහන් බව - ප්‍රීතිය - සොම්නස සලකා ගෙන ඒ අනුව දන් දෙති " .....

**7)** "සාරිපුත්ත, මෙහි ඇතැම් කෙනෙක් (සමථ-

විදර්ශනා චිත්තයට) චිත්තාලඞ්කාරයක් වනු පිණිස පැවිදි උතුමන්ට ආහාර-පානාදිය දන් දෙති. සාරිපුත්ත, ඇතැම් කෙනෙක් මෙසේ දන් දෙනවා නො වේ ද?''

**සැරියුත් තෙරණුවෝ:** ''එසේය, ස්වාමීනි,''

**බුදුරජු:** ''එලෙස දන් දී ඔහු මරණින් මතු බඹලොව උපදී. එම විපාකය ගෙවී යාමෙන් ඔහු මෙලොවට නො පැමිණෙනසුලු ව, අනාගාමී ව සුද්ධාවාසයන්හි උපත ලබා එහි දී පිරිනිවෙයි. (මෙම දායකයා බඹලොව උපත ලබන්නේ දානය නිසා නොව සමථ - විදර්ශනා භාවනා පුණ්‍ය බලය නිසා ය. දානය ද එයට රුකුලක් හෙවත් පරිවාර පුණ්‍යකර්මයක් වේ.) සාරිපුත්ත, ඇතැම් කෙනෙකුගේ දානය මහත්ඵල-මහානිසංසදායක වීමටත් ඇතැම් කෙනෙකුගේ දානය එසේ නො වීමටත් හේතුව මෙය යි.''

මෙම 'දානමහප්ඵල' සූත්‍ර දේශනාවෙන් මතුවන ඉතා වැදගත් ම කරුණ නම් දන් දීමේ දී සමථ - විදර්ශනා චිත්තයට චිත්තාලඞ්කාරයක් වනු පිණිස ම දන් දිය යුතු ය, යන්න යි. දානයක උපරිම ආනිසංස ධර්මයන් ලැබෙන්නේ එපරිද්දෙන් දන් දෙන විට ය. බොහෝදෙනෙකු දන් දෙන්නේ එහි විපාක පිළිබඳ ව අපේක්ෂාවෙන් යුතු ව ය. සමථ-විදර්ශනා චිත්තයන්ට අලඞ්කාරයක් වනු පිණිස දන් දෙන්නේ ඒ පිළිබඳ ව නියමාකාර අවබෝධයක් ඇති ශ්‍රාවකයන් විසින් පමණි. සමථ-විදර්ශනා චිත්තයන්ට චිත්තාලඞ්කාරයක් වනු පිණිස දන් දෙන්නේ කෙසේ ද යන වග පැහැදිලි වන කථාප්‍රවෘත්තියක් විනය පිටකයට අයත් මහාවග්ගපාළියෙහි සඳහන් ව ඇත. ඒ පුවත මෙසේ යි.

දිනක් බුදුරජුන් දැකීමට පැමිණි විශාඛා මහෝපාසිකාව භික්ෂුණීසඞ්ඝයාට වැසිසළු පිදීමටත් භික්ෂූන් වහන්සේලාට ආගන්තුක - දාන, ගමික - දාන,ගිලන් භික්ෂූන්ට දෙන දන්, ගිලානෝපස්ථායකයන්ට දෙන දන් ආදිය පිදීමටත් අවසර

ඉල්ලා සිටියා ය. එහි දී බුදුරජාණන් වහන්සේ ඇයගෙන් මෙසේ ප්‍රශ්න කළ සේක.

**බුදුරජු:** "විශාඛා උපාසිකාවනි, ඔබ මෙසේ දන් දීමට අවසර ඉල්ලා සිටින්නේ කවර නම් ආනිසංස දකිමින් ද?"

**මහෝපාසිකාව:** "ස්වාමීනි, මේ සැවැත් නුවරට පිටතින් පැමිණෙන භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේව හමු වී ඒ ඒ පළාත්වල වැඩවාසය කොට අපවත් වූ භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු විමසති. 'අසවල් පළාතේ අසවල් භික්ෂුව අපවත් විය. ඒ භික්ෂුව උපන්නේ කොතැනක ද?' යනාදි වශයෙන් ඒ භික්ෂූන් වහන්සේලා විමසන ප්‍රශ්නවලට පිළිතුරු දෙන භාග්‍යවතුන් වහන්සේ 'ඒ භික්ෂුව සෝතාපන්න කෙනෙකි..... සකදාගාමී කෙනෙකි..... අනාගාමී කෙනෙකි..... ඒ භික්ෂුව කලුරිය කොට අසවල් තැන උපත ලැබී ය. ඒ භික්ෂුව රහතන් වහන්සේ නමකි. එනිසා පිරිනිවී ගියේ ය' යනාදි වශයෙන් වදාරන සේක."

"ස්වාමීනි, එම තොරතුරු අසා සිටින මම පසු ව එම ආගන්තුක භික්ෂූන් වහන්සේලා වෙත ගොස් ඒ අපවත් වූ භික්ෂූන් වහන්සේලා සැවැත් නුවරට වැඩම කර තිබේ ද' යි කියා විමසමි. අපවත් වූ එම භික්ෂූන් වහන්සේලා සැවැත් නුවරට වැඩම කර ඇතැ'යි කියා දැන ගත් විට මා තුළ ඇති වන්නේ මෙබඳු පහන් බවකි. එනම්, 'ඒකාන්තයෙන් ම අපවත් වුණු ඒ ආර්යයන් වහන්සේලා මාගේ ආගන්තුක - දන්, ගමික - දන්, ගිලන් - දන් ආදිය වළඳා ඇති. (මාහට වූයේ මහත් ලාභයකි. මාගේ උපස්ථාන ලබා ඇත්තේ මෙබඳු උතුමෝ ය.)' මෙසේ සිහි කරන්නා වූ මා තුළ ප්‍රමුදිත බව ඇති වේ. ඒ ප්‍රමෝදය නිසා ප්‍රීතිය ඇති වේ. ප්‍රීතිය නිසා සන්සිඳීම ඇති වේ. සන්සිඳීම නිසා සුවය ඇති වේ. සුවය නිසා සිත සමාහිත වේ. මෙසේ

මා තුළ ඉන්ද්‍රිය ධර්ම - බල ධර්ම - බෝධ්‍යාඞ්ග ධර්ම වැඩීමට එම දන් දීම උපකාරී වේ.”

විශාඛා මහෝපාසිකාවගේ මෙම පිළිතුරෙන් පැහැදිලි වන්නේ එතුමිය සමථ - විදර්ශනා භාවනාවන්ට උපකාරයක් වනු පිණිස, සමථ - විදර්ශනා භාවනා චිත්තයන්ට අලඞ්කාරයක් වනු පිණිස දන් දුන් ආකාරය යි. එනිසා දන් දෙන සත්පුරුෂයෝ දානයේ ලෞකික විපාක පිළිබඳ ව ආශාව ඇති කර නො ගෙන, එය හුදෙක් කුලසිරිතක් ඉටු කිරීමක් ලෙස නො කොට නිර්වාණාවබෝධය ම අරමුණු කර ගෙන විශාඛා මහෝපාසිකා ව මෙන් සමථ - විදර්ශනා භාවනා චිත්තයන්ට අලඞ්කාරයක් වනු පිණිස ම දන් දෙන්නට වෑයම් කරත්වා!

# 4. දානානිසංස

දානානිසංස පිළිබඳ ව දැක්වෙන අගනා දේශනාවක් අඞ්ගුත්තරනිකායේ සත්තකනිපාතයෙහි සඳහන් වේ. භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩවසන සමයෙහි 'සීහ' (සිංහ) සේනාපතිතුමා භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණියේ ය. භාග්‍යවතුන් වහන්සේට වැඳ ගෞරව දක්වා පසෙකින් හුන් හෙතෙම භාග්‍යවතුන් වහන්සේ වෙතින් මෙසේ විමසුවේ ය.

**සීහ** ('සිංහ')**:** "ස්වාමීනි, තමාට ම අත්දකින්නට ලැබෙන (සන්දිට්ඨික) දාන විපාක ගැන සඳහන් කිරීමට හැකි ද?"

**බුදුරජු:** "සීහ, ඒ පිළිබඳ ව ඔබගෙන් ම විමසමි. ඔබට වැටහෙන පරිදි පිළිතුරු දෙන්න. සීහ, ඔබට මේ ගැන කුමක් ද සිතෙන්නේ ? ලොව මෙබඳු පුද්ගලයෝ දෙදෙනෙක් සිටිති. එක් අයෙක් ශ්‍රද්ධාව නැති මසුරු පුද්ගලයෙකි. අනෙක් තැනැත්තා ශ්‍රද්ධාවන්ත දානපතියෙකි. රහතන් වහන්සේලා පළමුවෙන් ම අනුකම්පා කරන්නේ මේ දෙදෙනාගෙන් කවර තැනැත්තාට ද? "

**සීහ:** "ස්වාමීනි, රහතන් වහන්සේලා කුමක් නිසා ශ්‍රද්ධාව නැති මසුරු පුද්ගලයාට පළමු ව අනුකම්පා කරත් ද? රහතන් වහන්සේලා පළමු ව අනුකම්පා කරන්නේ ශ්‍රද්ධාවන්ත දානපතියාට ය."

මෙලෙස, දන් දීමෙන් මෙලොව දී ම ලැබෙන ආනිසංස හයක් පිළිබඳ ව එම සූත්‍රයෙහි මෙසේ සඳහන් වේ.

1. රහතන් වහන්සේලා පළමුවෙන් ම සැදැහැති දායකයාට අනුකම්පා කිරීම.
2. රහතන් වහන්සේලා පළමුවෙන් ම සැදැහැති දායකයා වෙත එළඹීම.

3. රහතන් වහන්සේලා පළමුවෙන් ම සැදැහැති දයකයාගේ දනය පිළිගැනීම.
4. රහතන් වහන්සේලා පළමුවෙන් ම සැදැහැති දයකයාට ධර්මදේශනා කිරීම.
5. සැදැහැති දනපතියාගේ කීර්තිය දසත පැතිරී යාම.
6. සැදැහැති දනපතියාට ඕනෑ ම පිරිසක් මැදට නො බිය ව (විශාරද ව) යා හැකි බව.

දන් දීමෙන් ලැබෙන <u>සත්වැනි</u> ආනිසංසය නම්, මරණින් මතු සුගතිගාමී වීම යි.

දනානිසංස පිළිබඳ ව සඳහන් වන තවත් අගනා දේශනාවක් අඞ්ගුත්තරනිකායේ පඤ්චකනිපාතයෙහි සඳහන් වේ. වරක් භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩසිටින අවස්ථාවක දී සුමනා නම් වූ රාජකුමාරිකාව තම පරිවාර කුමරියන් සමග බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ මෙබඳු ප්‍රශ්නයක් විමසුවා ය.

**සුමනා:** “ස්වාමීනි, ශීලයෙන් එකසමාන ගුණයෙන් යුතු පැවිදි ශ්‍රාවකයෝ දෙදෙනෙක් සිටිති. ඉන් එක් අයෙක් දන් දෙන අතර අනෙක් තැනැත්තා දන් දෙන්නේ නැත. මේ දෙදෙනා ම මරණින් මතු දෙවියන් අතර උපත ලබති. එහි දී මෙම දෙදෙනාගේ වෙනසක් ඇති වේ ද?”

**බුදුරජු:** “සුමනාවෙනි, වෙනසක් ඇත. පෙර ජීවිතයෙහි දී දන් දුන් දිව්‍යපුත්‍රයා, පෙර දන් නුදුන් දිව්‍යපුත්‍රයාට වඩා කරුණු පහකින් විශේෂත්වයට පත් වේ. එනම් දිව්‍ය වූ ආයුෂ - වර්ණ - සැප - යශස් - අධිපතිභාවය යන කරුණුවලින් පෙර දන් දුන් දිව්‍යපුත්‍රයා, දන් නුදුන් දිව්‍යපුත්‍රයාව ඉක්මවා සිටී.”

**සුමනා:** “ස්වාමීනි, ඒ දිව්‍යපුත්‍රයන් දෙදෙනා දෙව්ලොවින් චුත වී මිනිස්ලොව යළි උපත ලබන්නේ නම්, එසේ උපත ලැබූ ඔවුන් දෙදෙනාගේ වෙනසක් ඇති වේ ද?”

බුදුරජු: “සුමනාවෙනි, වෙනසක් ඇති වේ. ඒ දෙදෙනා මිනිස්ලොව උපන් කල පෙර දන් දුන් තැනැත්තා, පෙර දන් නුදුන් තැනැත්තාව මානුෂික වූ ආයුෂ - වර්ණ - සැප - යශස් හා අධිපතිභාවය යන කරුණුවලින් ඉක්මවා සිටියි.”

සුමනා: “ස්වාමීනි, ඒ දෙදෙනා ම ගිහිගෙයින් නික්මී පැවිදි වන්නේ නම්, එසේ පැවිදි වූ ඒ දෙදෙනා වහන්සේගේ වෙනසක් ඇති වන්නේ ද?”

බුදුරජු: “සුමනාවෙනි, වෙනසක් ඇති වන්නේ ය. ඒ දෙදෙනා වහන්සේ අතරින් පෙර දන් දුන් භික්ෂුව, පෙර දන් නුදුන් භික්ෂූන් වහන්සේව කරුණු පහකින් ඉක්මවා සිටින්නේ ය. දන් දුන් භික්ෂුව දායකයන්ගේ ආයාචනයෙන් ම බහුල ව සිවුරු - පිණ්ඩපාත - සෙනසුන් - ගිලන්පස පරිභෝග කරන්නේ ය. ආයාචනයෙන් තොර ව පරිභෝග කරන දේ අල්ප ය. එමෙන් ම සෙසු භික්ෂූන් වහන්සේලා ද එම භික්ෂුවට ප්‍රිය මනාප අයුරින් බහුල ව කටයුතු කරත්. අමනාප දේ සිදු කරන්නේ අල්ප වශයෙනි.”

සුමනා: “ස්වාමීනි, ඒ දෙදෙනා වහන්සේ ම අර්හත්වයට පත් වෙතොත් එහි වෙනසක් වේ ද?”

බුදුරජු: “සුමනාවෙනි, දෙදෙනා වහන්සේගේ විමුක්තියෙහි වෙනසක් නො පනවමි.”

සුමනා: “ස්වාමීනි, මෙය ඉතා අසිරිමත් ය. පුදුම සහගත ය. (කරුණු මෙසේ බැවින්) දන් දෙන්නට සුදුසු ම ය. පින් කරන්නට සුදුසු ම ය. දෙව්ලොව උපන් කල ද පින බෙහෙවින් උපකාරී වෙයි. මිනිස්ලොව උපන් කල ද පින බෙහෙවින් උපකාරී වෙයි. පැවිදි වූ කල ද පින බෙහෙවින් උපකාරී වෙයි.”

සුමනා රජකුමරිය මෙසේ පැවසූ කල භාග්‍යවතුන් වහන්සේ ද එය අනුදන වදරමින් මෙලොව පරලොව සැප

විපාක ගෙන දෙන දානාදි පින්කම් සිදු කිරීම සුදුසු ම බව වදාළ සේක.

සීහ සේනාපතිතුමාට වදාළ දානානිසංස පිළිබඳ වූ තවත් සූත්‍රයක් අඞ්ගුත්තර-පඤ්චකනිපාතයෙහි මෙසේ සඳහන් වේ.

භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර සමීපයේ මහවනයෙහි වැඩවෙසෙන සමයක භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණි 'සීහ' සේනාපතිතුමා තමාට ම අත්දකින්නට ලැබෙන දානානිසංස පිළිබඳ ව වදාරන ලෙස ආරාධනා කළේ ය. ඒ අනුව මේ ජීවිතයේ දී තමාට ම අත්දකින්නට ලැබෙන දානානිසංස පිළිබඳ ව භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

**1.** දන් දෙන දානපතියා බොහෝදෙනාට ප්‍රිය-මනාප කෙනෙක් වේ.
**2.** යහපත් වූ සත්පුරුෂයෝ ඔහුව ඇසුරු කරති.
**3.** දානපතියා පිළිබඳ වූ කීර්ති රාවය දසත පැතිරී යයි.
**4.** දානපතියාට නිර්භය ව විශාරද ව රජ - බමුණු ආදි ඕනෑ ම පිරිසක් මැදට යා හැකි වේ.
**5.** පස්වැනි ආනිසංසය වූ කලී පරලොව දී ලැබෙන්නකි. එනම්, දානපතියා මරණින් මතු සුගතිගාමී වේ.

තව ද අඞ්ගුත්තර-පඤ්චකනිපාතයේ භෝජන සූත්‍රයෙහි දායකයාට ලැබෙන දානානිසංස පිළිබඳ ව මෙසේ ද සඳහන් වේ. දන් දෙන දායකයා ප්‍රතිග්‍රාහකයාට ආයුෂ - වර්ණය - සැපය - බලය - '**පටිභාණ**' හෙවත් වැටහීමේ ශක්තිය ලබා දේ. එම කරුණු දන් දෙන දායකයාහට එම පුණ්‍යකර්මයන්ගේ විපාක වශයෙන් උසස් වූ දිව්‍යමානුෂික ආයු - වර්ණ - සැප - බල - ප්‍රඥා ලැබෙන්නේ ය.

## 5. දානය ගැන දත යුතු තවත් කරුණු රැසක්

'කාලදාන' හෙවත් සුදුසු අවස්ථාවෙහි දියහැකි දාන පහක් පිළිබඳ ව පඤ්චකනිපාතයෙහි සඳහන් ව තිබේ.

1. ආගන්තුක ව පැමිණි පැවිදි උතුමන්ට දන් දීම. (ආගන්තුක දාන)
2. චාරිකාවේ පිටත් වන පැවිදි උතුමන්ට දන් දීම. (ගමික දාන)
3. ගිලන් භික්ෂූන් වහන්සේලාට සුදුසු පරිදි දන් පිරිනැමීම. (ගිලන් දන්)
4. ආහාරපාන අඩු දුර්භික්ෂ කාලවල දී දෙන දාන. (දුර්භික්ෂ දාන)
5. භවභෝගවල මුල් අස්වැන්න හෙවත් අග්‍රභාගය දන් දීම. (අගසස් දන්)

මෙසේ සුදුසු අවස්ථාවන්හි මෙම කාල අනුව දන් දෙන දායකයන්ට ද මෙලොව-පරලොව දෙලොවට ම ආනිසංසදායක වූ පුණ්‍යකර්මයන් සිදු කර ගත හැකි ය.

බුදුසසුනෙහි ශ්‍රාවක පිරිස භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යනුවෙන් සිවුවැදෑරුම් වෙති. එයින් භික්ෂු-භික්ෂුණී යන පැවිදි ශ්‍රාවක පිරිස යැපෙන්නේ උපාසක-උපාසිකා යන ගිහි ශ්‍රාවක පිරිස් විසින් ප්‍රදානය කරනු ලබන චීවර-පිණ්ඩපාත-සේනාසන-ගිලානප්‍රත්‍යය යන සිවුපසයෙනි. ඒ අනුව පැවිදි ශ්‍රාවක පිරිස ප්‍රතිග්‍රාහක පක්ෂයට ද ගිහි-ශ්‍රාවක පිරිස දායක පක්ෂයට ද අයත් වෙති. එසේ ද වුවත් පැවිදි-ශ්‍රාවකයන් වහන්සේලාට ද ඔවුනොවුන් අතර දන් දිය හැකි ය. දානය වනාහි සියල්ලන් විසින් ම පුරුදු පුහුණු කළ යුතු උසස් ගුණයක් බැවින් පැවිදි-ශ්‍රාවකයන් වහන්සේලා විසින් ද සුදුසු පරිදි ආමිසදාන, අභයදාන, ධර්මදාන කුසල කර්මයන් සිදු කළ යුතු ය. පුරාණයෙහි වැඩසිටි මහරහතන් වහන්සේලා පවා දුන් දාන පිළිබඳ ව විනය-සූත්‍ර පිටකයන්හි සඳහන් ව ඇත. ධර්මසේනාපති සාරිපුත්ත මහරහතන් වහන්සේ දුන් දානයක් පිළිබඳ ව සූත්‍ර පිටකයේ පේතවත්ථු ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් වේ.

වරක්, ඇටසැකිල්ලක් බඳු ඉතා කෙසඟ සිරුරක් ඇති ප්‍රේතියක් සාරිපුත්ත මහරහතන් වහන්සේ හමුවට පැමිණියා ය.

**සැරියුත් තෙරණුවෝ:** "ඉතා කෙසඟ සිරුරක් ඇති විරූපී ඔබ, කවරෙක් ද?"

**ප්‍රේතිය:** "ස්වාමීනි, මම පෙර භවයක දී ස්වාමීන් වහන්සේගේ මව වී සිටියෙමි. දැන් මම ප්‍රේතියක් ව බෙහෙවින් දුක් විඳිමි. කුස ගින්නෙන් පෙළෙන්නා වූ මාගේ ආහාරය වන්නේ ස්ත්‍රී-පුරුෂයන්ගේ හා සතුන්ගේ ශරීරවලින් ගලන ලේ, සැරව බඳු අපිරිසිදු දේ ය. මාහට ඇඳීමට වස්ත්‍රයක් නැත. විසීමට තැනක් නැති බැවින් සොහොනෙහි වෙසෙමි. ස්වාමීනි, මෙම දුකින් මා නිදහස් කර දෙනු මැනවි."

මෙම ප්‍රේතිය ගැන අනුකම්පා කළ සාරිපුත්ත මහරහතන් වහන්සේ විසින් මොග්ගල්ලාන මහරහතන් වහන්සේ, කොට්ඨිත මහරහතන් වහන්සේ ආදි රහතන් වහන්සේලාට ආරාධනා කොට, තමන් වහන්සේට ලැබුණු දානය හා අවශේෂ පිරිකර ආදිය එම රහතන් වහන්සේලාට පූජා කොට, ප්‍රේතියට පින් අනුමෝදන් කරන ලදී. එම පින් අනුමෝදන් වූ ප්‍රේතිය එම ආත්මභාවයෙන් චුත වී දිව්‍යාත්මභාවයකට පත් ව මොග්ගල්ලාන මහරහතන් වහන්සේ වෙත පැමිණ වන්දනා කොට සාරිපුත්ත මහරහතන් වහන්සේ තමාට කළ උපකාරය පිළිබඳ ව ස්තුතිය පළ කළා ය.

තව ද උප්පලවණ්ණා මහරහත් මෙහෙණින් වහන්සේ දුන් දානයක් පිළිබඳ ව විනය පිටකයෙහි මෙසේ සඳහන් වේ. දිනක් උප්පලවණ්ණා තෙරණිය වනයෙහි භාවනානුයෝගී ව වෙසෙන අවස්ථාවක සොරු පිරිසක් සතෙකු මරා ගෙන ඊට නුදුරු තැනක සිට මස් පලහා කෑමට සූදානම් වූහ. එම පිරිසෙහි සොරදෙටුවා උප්පලවණ්ණා තෙරණිය සිටින තැනට පැමිණ සමීපයෙහි වූ ගසක මස්ගොටුවක් එල්ලා 'යම් ශ්‍රමණයෙකු

විසින් මේ මස්ගොටුව දකිනු ලැබේ ද ඔහුට මෙය දෙන ලද්දේ ය' යනුවෙන් පැවසී ය. එම මොහොතෙහි ම සමාධියෙන් නැඟී සිටි තෙරණිය එම වචන ශ්‍රවණය කළ අතර 'දැන් මෙහි වෙනත් ශ්‍රමණයෙකු නැති බැවින් මෙම මස්ගොටුව මා සතු ය' යනුවෙන් තීරණය කළා ය. මස්ගොටුව රැගෙන මෙහෙණවරට ගිය තෙරණිය එය පිසවා ගෙන බුදුරජාණන් වහන්සේට පූජා කිරීම සඳහා වේළුවනාරාමයට රැගෙන ගියා ය. මෙසේ පෙර දවස මහරහතන් වහන්සේලා පවා දුන් දානයන් ගැන තොරතුරු පෙළ-අටුවා දෙකෙහි ම සඳහන් වේ.

වර්තමානයෙහි ද භික්ෂූන් වහන්සේලා සිදු කරන විවිධ දානමය පින්කම් පිළිබඳ ව අසන්නට දකින්නට ලැබේ. මෙලෙස දන් දීම වනාහි ගිහි-පැවිදි දෙපිරිස තුළ ම වර්ධනය කර ගත යුතු වන උතුම් ගුණාංගයකි.

මෙහි දී සඳහන් කළ යුතු තවත් උතුම් බුද්ධවචනයකි, අඞ්ගුත්තරනිකායේ නවකනිපාතයෙහි සඳහන් වන වේලාම සූත්‍රය. භාග්‍යවතුන් වහන්සේ විසින් සැවැත් නුවර ජේතවනාරාමයෙහි දී අනාථපිණ්ඩික සිටුතුමා උදෙසා වදාළ එම දේශනාවෙහි මෙසේ සඳහන් වේ.

දිනක් අනාථපිණ්ඩික සිටුතුමා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ගෞරව දක්වා පසෙකින් අසුන් ගත් අතර භාග්‍යවතුන් වහන්සේ සිටුතුමා වෙතින් මෙසේ විමසා වදාළ සේක.

**බුදුරජු:** "ගෘහපතිතුමනි, ඔබගේ නිවසෙහි දන් දෙනු ලැබේ ද?"

**සිටුතුමා:** "ස්වාමීනි, මාගේ නිවසෙහි දන් දෙනු ලැබේ. එහෙත් දෙනු ලබන්නේ කාඩි සමග නිවුඩු බත් ය." (මෙසේ දෙනු ලැබුයේ අනාථයන්ට ය' යි අට්ඨකථාවෙහි සඳහන් වේ)

**බුදුරජු:** "ගෘහපතිතුමනි, රළු දෙයක් හෝ වේවා ප්‍රණීත දෙයක්

හෝ වේවා යමෙක් නො සැලකිල්ලෙන් දන් දෙයි ද, ගෞරවයෙන් තොර ව දන් දෙයි ද, සියතින් නො දෙයි ද, නිරතුරු ව නො දෙයි ද, කර්මඵල විශ්වාසයෙන් යුතු ව නො දෙයි ද එසේ දෙන දනයෙහි විපාක, යම් තැනක විපාක දෙන කල්හි, උසස් ලෙස ආහාරපාන ගැනීම සඳහා ඔහුගේ සිත නො නැමෙයි. උසස් ලෙස වස්ත්‍ර පරිහරණය සඳහා ඔහුගේ සිත නො නැමෙයි. උසස් ලෙස යානවාහන පරිහරණය සඳහා ඔහුගේ සිත නො නැමෙයි. උසස් ලෙස පස්කම්සුව විඳීම සඳහා ඔහුගේ සිත නො නැමෙයි. ඔහුගේ අඹුදරුවෝ හෝ සේවකසේවිකාදීහු හෝ කම්කරුවෝ හෝ වෙත් ද ඔවුහු ද කීකරු නො වෙති. ගෘහපතිතුමනි, එයට හේතුව කුමක් ද? ගෘහපතිතුමනි, නො සැලකිල්ලෙන් සිදු කළ (කුසල) කර්මයෙහි විපාක එබඳු බැවිනි.

ගෘහපතිතුමනි, රළු දෙයක් හෝ වේවා ප්‍රණීත දෙයක් හෝ වේවා යමෙක් සකසා දන් දෙයි ද, ගෞරවයෙන් යුතු ව දන් දෙයි ද, සියතින් ම දන් දෙයි ද, නිරතුරු ව දන් දෙයි ද, කර්මඵල විශ්වාසයෙන් යුතු ව දන් දෙයි ද, එසේ දෙන දනයෙහි විපාක, යම් තැනක විපාක දෙන කල්හි, උසස් ලෙස ආහාරපාන ගැනීම සඳහා ඔහුගේ සිත නැමෙයි. උසස් ලෙස වස්ත්‍ර පරිහරණය සඳහා ඔහුගේ සිත නැමෙයි. උසස් ලෙස යානවාහන පරිහරණය සඳහා ඔහුගේ සිත නැමෙයි. උසස් ලෙස පස්කම්සුව විඳීම සඳහා ඔහුගේ සිත නැමෙයි. ඔහුගේ අඹුදරුවෝ හෝ සේවකසේවිකාදීහු හෝ කම්කරුවෝ හෝ වෙත් ද ඔවුහු ද ඉතා කීකරු වෙති. සුවච වෙති.ගෘහපතිතුමනි, එයට හේතුව කුමක් ද? ගෘහපතිතුමනි, සැලකිල්ලෙන් සිදු කළ (කුසල) කර්මයෙහි විපාක එබඳු බැවිනි.

ගෘහපතිතුමනි, පෙර සිදු වූ පුවතක් මෙසේ යි. පෙර වේලාම නමින් බමුණෙක් වාසය කළේ ය.

හෙතෙම මෙබඳු මහාදනයක් දුන්නේ ය. එනම් රිදී පිරවූ රන්-පාත්‍ර අසූහාරදහසක් දුන්නේය. රන් පිරවූ රිදී-පාත්‍ර අසූහාරදහසක් දුන්නේ ය. අමුරන් පිරවූ කස්ලෝ-පාත්‍ර අසූහාරදහසක් දුන්නේ ය. රනින් සැරසූ රන්-ධජ ඇති ඇතුන් අසූහාරදහසක් දුන්නේ ය. සිංහසම්, ව්‍යාඝ්‍රසම්, දිවිසම් ඇතිරූ රන්-ධජ සහිත වූ රනින් සරසන ලද රථ අසූහාරදහසක් දුන්නේ ය. කිරි දෙවන කස්ලෝ භාජන සහිත දුහුල් වස්ත්‍ර අතුළ කිරි දෙනුන් අසූහාරදහසක් දුන්නේ ය. අබරණින් සැරසුණු අසූහාරදහසක් කන්‍යාවන් දුන්නේ ය. එළුලොම් ඇතිරිලි ආදිය අතුරන ලද උඩුවියන් සහිත වූ ආසන අසූහාරදහසක් දුන්නේ ය. දුන්නා වූ ආහාර-පාන-කැවිලි-පෙවිලි ආදිය ගැන කවර කථාවක් ද? එය ගඟක් ගලන්නාක් මෙනි.

ගෘහපතිතුමනි, ඔබට මෙබඳු අදහසක් ඇති විය හැකි ය. එනම්, 'එකල්හි වේලාම බ්‍රාහ්මණයා නම් අනෙකෙකි. ඔහු විසින් එම මහාදනය දෙන ලද' යි කියා යි. ගෘහපතිතුමනි, එය එසේ නො වේ. එසමයෙහි වේලාම බමුණා නම් තථාගතයන් වහන්සේ ම ය. මම එම මහාදනය දුනිමි.

ගෘහපතිතුමනි, ඒ දනයෙහි දන් පිළිගැනීමට සුදුසු වූ දක්ෂිණාර්හ කිසිවෙක් නො වී ය. එම දක්ෂිණාව පිරිසිදු කළ හැකි කිසිවෙක් එයට නො පැමිණියේ ය. ගෘහපතිතුමනි, වේලාම බමුණා යම් මහාදනයක් දුන්නේ ද එයට වඩා එක් සෝතාපන්න උතුමෙකුට දන් පිරිනැමීම මහත්ඵල මහානිසංසදයක ය.

ගෘහපතිතුමනි, වේලාම බමුණා දුන් දනයටත් වඩා සෝතාපන්න උතුමන් සියයකට දන් දීමටත් වඩා එක් සකදාගාමී උතුමෙකුට දන් දීම මහත්ඵලතර වෙයි.

ගෘහපතිතුමනි, වේලාම බමුණා දුන් දනයටත් වඩා සකදාගාමී උතුමන් සියයකට දන් දීමටත් වඩා එක් අනාගාමී උතුමෙකුට දන් දීම මහත්ඵලතර වෙයි.

ගෘහපතිතුමනි, වේලාම බමුණා දුන් දනයටත් වඩා අනාගාමී උතුමන් සියයකට දන් දීමටත් වඩා එක් රහතන් වහන්සේනමකට දන් දීම මහත්ඵලතර වෙයි.

ගෘහපතිතුමනි, වේලාම බමුණා දුන් දනයටත් වඩා රහතන් වහන්සේලා සියක්නමකට දන් දීමටත් වඩා එක් පසේබුදුරජාණන් වහන්සේනමකට දන් දීම මහත්ඵලතර වෙයි.

ගෘහපතිතුමනි, වේලාම බමුණා දුන් දනයටත් වඩා පසේබුදුරජාණන් වහන්සේලා සියක්නමකට දන් දීමටත් වඩා එක් සම්මාසම්බුදුරජාණන් වහන්සේනමකට දන් දීම මහත්ඵලතර වෙයි.

ගෘහපතිතුමනි, වේලාම බමුණා දුන් දනයටත් වඩා එක් සම්මාසම්බුදුරජාණන් වහන්සේනමකට දන් දීමටත් වඩා බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂුසඞ්ඝයාට දන් දීම මහත්ඵලතර වෙයි.

ගෘහපතිතුමනි, බුදුරජුන් ප්‍රමුඛ භික්ෂුසඞ්ඝයාට දන් දීමට වඩා සතර දිගින් වඩින මහාසඞ්ඝරත්නය උදෙසා විහාරයක් කරවා පිදීම මහත්ඵලතර වෙයි.

ගෘහපතිතුමනි, සතර දිගින් වඩින මහාසඞ්ඝරත්නය උදෙසා විහාරයක් කරවා පිදීමට වඩා යමෙක් පහන් සිතින් යුතු ව බුද්ධ, ධම්ම, සඞ්ඝ යන රත්නත්‍රය සරණ යන්නේ නම්, එය ම මහත්ඵලතර වෙයි.

ගෘහපතිතුමනි, යමෙක් (තිසරණයෙහි පිහිටා) පහන්

සිතින් යුතු ව, සතුන් මැරීමෙන් වැළකීම - සොරකම් කිරීමෙන් වැළකීම - කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම - බොරු කීමෙන් වැළකීම - මත්පැන්/මත්ද්‍රව්‍ය පරිහරණයෙන් වැළකීම යන මෙම ශික්ෂාපදයන් සමාදන් වෙයි ද එය පහන් සිතින් තෙරුවන් සරණ යාමටත් වඩා, මහත්ඵලතර වෙයි.

ගෘහපතිතුමනි, යමෙක් සුවඳක් සිඹින කාලය තරම් ස්වල්ප මොහොතක් මෙත් සිත වඩයි ද එය පහන් සිතින් යුතු ව පන්සිල් රැකීමටත් වඩා, මහත්ඵලතර වෙයි.
(සූත්‍රදේශනාවෙහි ඉහත කොටස දක්වන ලද්දේ සංක්ෂිප්ත වශයෙනි.)

ගෘහපතිතුමනි, වේලාම බ්‍රාහ්මණයා යම් මහාදනයක් දුන්නේ ද එමෙන් ම යමෙක් සෝතාපන්න උතුමෙකුට දන් දෙයි ද, යමෙක් සෝතාපන්න උතුමන් සියයකට දන් දෙයි ද, යමෙක් සකදාගාමී උතුමෙකුට දන් දෙයි ද, යමෙක් සකදාගාමී උතුමන් සියයකට දන් දෙයි ද, යමෙක් අනාගාමී උතුමෙකුට දන් දෙයි ද, යමෙක් අනාගාමී උතුමන් සියයකට දන් දෙයි ද, යමෙක් රහතන් වහන්සේනමකට දන් දෙයි ද, යමෙක් රහතන් වහන්සේලා සියක්නමකට දන් දෙයි ද, යමෙක් පසේබුදුරජාණන් වහන්සේනමකට දන් දෙයි ද, යමෙක් පසේබුදුරජාණන් වහන්සේලා සියක්නමකට දන් දෙයි ද, යමෙක් තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේට දන් දෙයි ද, යමෙක් බුද්ධ ප්‍රමුඛ භික්ෂුසඞ්ඝයාට දන් දෙයි ද, යමෙක් සතර දිගින් වඩින මහාසඞ්ඝරත්නය උදෙසා විහාරයක් කරවා පූජා කරයි ද, යමෙක් පහන් සිතින් යුතු ව බුද්ධරත්නය, ධර්මරත්නය, සඞ්ඝරත්නය සරණ යයි ද, යමෙක් පහන් සිතින් යුතු ව සතුන් මැරීමෙන් වැළකීම - නුදුන් දෙය සොරා ගැනීමෙන් වැළකීම -

කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම - බොරු කීමෙන් වැළකීම - රහමෙර පානයෙන් වැළකීම යන මෙම ශික්ෂාපද සමාදන් වෙයි ද, යමෙක් අඩු ම තරමින් සුවඳක් සිඹින තරම් මොහොතක් මෙත් සිත වඩයි ද, ඒ සියල්ලට ම වඩා අසුරු සැණක් ගසන තරම් මොහොතක් අනිත්‍යසංඥාව වැඩීම ම මහත්ඵලතර වෙයි.''

භාග්‍යවතුන් වහන්සේ අනාථපිණ්ඩික සිටුතුමාණන්ට දේශනා කොට වදාළ පරිදි දනයට වඩා ශීලය ද ශීලයට වඩා සමථ භාවනාව ද එයටත් වඩා විදර්ශනා භාවනාව ද ආනිසංසදායක වේ. එබැවින් දන් දෙන සුපින්වත්හු දන් දීමෙන් නො නැවතී ශීල, භාවනා පිළිවෙත් ද සපුරා ගැනීමට වෑයම් කළ යුත්තාහ.

දායක පින්වතුන් විසින් මතක තබා ගත යුතු තවත් වැදගත් කරුණක් අඞ්ගුත්තර - දසකනිපාතයේ ජාණුස්සෝණි සූත්‍රයෙහි සඳහන් වේ. එහි දැක්වෙන පරිදි කයින්, වචනයෙන් හා සිතින් දුසිරිතෙහි යෙදෙමින් ආහාරපානාදිය දන් දෙන තැනැත්තා එම දුසිරිත් හේතුවෙන් මරණින් මතු ඇත්, අස්, සුනඛ බඳු තිරිසන් සතෙකු ලෙස උපත ලැබිය හැකි බවත්, එසේ නමුත් පෙර දන් දුන් නිසා සෙසු තිරිසන් සතුන්ට වඩා සැප සේ වසන බවත්, භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදී. එසේ ම කයින් වචනයෙන් හා සිතින් සුචරිතයෙහි යෙදෙමින් දන් දුන් තැනැත්තා එම සුචරිතය හේතුවෙන් මරණින් මතු දිව්‍ය-මනුෂ්‍ය සුගතීන්හි උපත ලබන බවත් පෙර දන් දුන් නිසා සෙසු දිව්‍ය-මනුෂ්‍යයන්ට වඩා සැප සේ වසන බවත් තව දුරටත් වදාරන ලදී. ඒ නිසා දන් දෙන සුපින්වත්හු දුසිරිතෙන් වැළකී සිල්වත් දිවිපෙවෙතක් ගත කරමින් ම දානාදි පින්කම් කිරීමට අධිෂ්ඨාන කර ගත යුත්තාහ.

# 6. දානයෙන් භාවනාවට

දානය භාවනාවට පදනම් වන ආකාරයක් ද භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. දස-අනුස්සති භාවනා කර්මස්ථාන යටතේ විස්තර වන 'චාගානුස්සති' භාවනාවෙන් කියැවෙන්නේ දන් දීම භාවනාවට පදනම් කර ගනිමින් දානයෙහි අනුසස් සිහි කිරීම පිළිබඳ ව යි. චාගානුස්සති භාවනාව වඩන පිළිවෙළ මෙසේ යි.

චාගානුස්සති (දන් දීමේ අනුසස් සිහි කිරීමේ) භාවනාව වඩනු කැමති යෝගාවචරයා ස්වභාවයෙන් ම දන් දීමෙහි ඇලුණු සිතැත්තෙකු විය යුතු ය. එසේ නැතහොත් චාගානුස්සති භාවනාව අරඹන යෝගාවචරයා 'මම අද පටන්, ප්‍රතිග්‍රාහකයෙකු ඇති කල්හි එක බත් පිඬුවක් හෝ දන් නො දී නො වළඳන්නෙමි' යි කියා සමාදන් වී එදින ශීලාදි විශේෂ ගුණයෙන් යුතු ප්‍රතිග්‍රාහකයෙකුට ශක්ති පමණින් දන් දී විවේක තැනක පහසු ලෙස අසුන් ගෙන එය නිමිති කර ගෙන මෙලෙස සිහි කළ යුතු ය.

"මාහට සිදු වූයේ ලාභයකි. එනම්, මම මසුරුමලින් යට වූ ප්‍රජාවෙහි මසුරුමල දුරු කර ගත් සිතින් යුතු ව වෙසෙමි ද දන් දීම සඳහා සූදනම් වූ අත් ඇති ව, දන් දීම පිණිස මා සතු දේ අත්හැර, දන් දීමෙහි ඇලුණු සිතින් යුතු ව යමක් ඉල්ලන්නට සුදුස්සෙක් ව, දන් දීමෙහි ද දාන සංවිභාගයෙහි ද ඇලුණු සිතින් යුතු ව වාසය කරමි ද එය මා ලත් මිනිසත්බව පිළිබඳ මහත් වූ පුණ්‍යලාභයකි."

මෙසේ තමාගේ ත්‍යාගශීලී ගුණය සිහි කරන විට සිත රාගයෙන් යට නො වේ. එමෙන් ම ද්වේෂයෙන් ද මෝහයෙන් ද සිත යට නො වේ. ත්‍යාග ගුණය අරමුණු කෙරෙමින් සිත ඒ පිළිබඳ ව ඍජු ව යොමු වී පවතී. මෙලෙස ත්‍යාග ගුණය අරමුණු කර ගෙන සිත එකග වන විට එක මොහොතක දී ධ්‍යානාංග පහළ වනු ඇත. ත්‍යාග ගුණයෙහි ගැඹුරු බව නිසා ද නොයෙක් ආකාරයෙන් ත්‍යාග ගුණය සිහි කරන බැවින් ද චාගානුස්සති භාවනාවෙන් අර්පණා ධ්‍යාන නො ලැබෙන අතර උපචාර ධ්‍යානයට පමණක්

සමාධිය සීමා වේ.

චාගානුස්සතිය වඩන යෝගාවචරයාට ආනිසංස රැසක් ලැබේ. චාගානුස්සති භාවනාව වඩන යෝගාවචරයා ත්‍යාගයෙහි ආනිසංස පිළිබඳ ව භාවනාව තුළින් ද දකින බැවින් බෙහෙවින් ම ත්‍යාගයෙහි ඇලුණු සිතැත්තෙක් වෙයි. නිර්ලෝභී පුද්ගලයෙක් වෙයි. මෛත්‍රියෙන් කටයුතු කරන්නෙක් වෙයි. විශාරද (නිර්භය) පුද්ගලයෙක් වෙයි. ප්‍රීති, ප්‍රමෝද බහුල පුද්ගලයෙක් වෙයි. විශේෂ මාර්ගඵලාධිගමයකට පත් නො වුවහොත් චාගානුස්සතිය වැඩීමේ කුසලයෙන් සුගතිගාමී වෙයි.

මෙලෙස දනය භාවනාවට ද උපකාරී වන අයුරු වටහා ගෙන දනය මුල් කර ගෙන දන - ශීල - භාවනා යන ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවන් ම සම්පූර්ණ කර ගැනීමට වෑයම් කළ යුතු ය.

# 7. දානය සඳහා මුල් වන කුසල් සිත්

දානය වනාහි කාමාවචර කුසල කර්මයකි. ඒ අනුව දානමය කුසල කර්මයක් සිදු කෙරෙනුයේ අභිධර්මයෙහි සඳහන් වන කාමාවචර කුසල් සිත් අට මුල් වීමෙනි. ඒවා නම්,

1. **සෝමනස්සසහගත - ඤාණසම්පයුත්ත - අසඞ්ඛාරික චිත්තය** (සොම්නසින් යුතු ව නුවණින් යුතු ව එක්වර ම පහළ වන කුසල් සිත)
2. **සෝමනස්සසහගත - ඤාණසම්පයුත්ත - සසඞ්ඛාරික චිත්තය** (සොම්නසින් යුතු ව නුවණින් යුතු ව නැවත නැවත උත්සාහ කරවීමෙන් පහළ වන කුසල් සිත)
3. **සෝමනස්සසහගත - ඤාණවිප්පයුත්ත - අසඞ්ඛාරික චිත්තය** (සොම්නසින් යුතු ව නුවණින් තොර ව එක්වර ම පහළ වන කුසල් සිත)
4. **සෝමනස්සසහගත - ඤාණවිප්පයුත්ත - සසඞ්ඛාරික චිත්තය** (සොම්නසින් යුතු ව නුවණින් තොර ව නැවත නැවත උත්සාහ කරවීමෙන් පහළ වන කුසල් සිත)

මෙම සිත් සතරෙහි යෙදෙන සොම්නස වෙනුවට උපේක්ෂාව යෙදීමෙන් උපේක්ෂා සහගත කුසල් සිත් ද සතරක් වේ. ඒ අනුව කාමාවචර කුසල් සිත් ගණන අටක් වේ. මෙබඳු කුසල විපාක සිතකින් ලැබෙන ප්‍රතිසන්ධියෙන් කාමාවචර-භූමියට අයත් මිනිස්ලොව හා දිව්‍යලෝක සයෙහි උපතක් ගෙන දෙයි.

# 8. දානය 'පිනක්' ද 'කුසලයක්' ද?

දානය වනාහි 'පිනක්' වශයෙන් හැඳින්වුවත් 'ලෞකික-කුසලයක්' වශයෙන් හැඳින්වුවත් එහි අර්ථය එකක් ම ය. දාන - ශීල - භාවනා ආදි කුසල ධර්මයන්හි යෙදෙන විට සිත පිරිසිදු වන බැවින් දානාදියට 'පුඤ්ඤ' හෙවත් 'පින්' ය යි කියනු ලැබේ. දානාදි පින්කම්හි යෙදෙන විට අකුසල් දුරු වන බැවින් එයට ම 'කුසල්' (ලෞකික) ය යි කියනු ලැබේ. පින (කුසලය) 'වට්ටගාමිනී' හා 'විවට්ටගාමිනී' වශයෙන් දෙවැදෑරුම් වේ. 'වට්ටගාමිනී' කුසලය යනු භව-සැප අපේක්ෂා කරමින් භව-සැප ලබනු පිණිස සිදු කරන කුසල් (පින්) ය. 'විවට්ටගාමිනී' කුසලය යනු භවනිරෝධය හෙවත් නිවන සාක්ෂාත් කිරීම පිණිස සිදු කරන දාන - ශීල - භාවනා ආදි කුසල (පුණ්‍ය) ධර්මයෝ ය. එනිසා දානාදි පින්කම්හි නියැලෙන සුපින්වත්හු විවට්ටගාමිනී ලෙස එම පින්කම් සිදු කිරීමට වෑයම් කළ යුත්තාහ. (ඉහත සඳහන් පරිදි විශාඛා මහෝපාසිකාව දුන් දාන විවට්ටගාමිනී කුසල කර්මයෝ ය.)

මෙබඳු අසිරිමත් දානමය කුසල කර්මයන් බුදුසසුනින් බැහැර වෙනත් සමයක දක්නට නො ලැබේ. එනිසා බුද්ධෝත්පාද කාලයක උපත ලැබූ සත්පුරුෂ සැම විසින් දානාදි පින්කම් කොට ශීල-භාවනාදි පිළිවෙත් පුරා ස්වර්ග මෝක්ෂ සම්පත් ද ප්‍රතිලාභ කර ගනිමින් අප්‍රමාදී ව සසර දුකින් මිදීමට වෑයම් කරත්වා**!**

සාධු **!** සාධු **!!** සාධු **!!!**


***ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය:***

- මජ්ඣිමනිකාය (තෘතීය භාගය) බු:ජ:
- අඞ්ගුත්තරනිකාය (පඤ්චකනිපාතය) බු:ජ:
- අඞ්ගුත්තරනිකාය (සත්තකනිපාතය) බු:ජ:
- අඞ්ගුත්තරනිකාය (නවකනිපාතය) බු:ජ:
- අඞ්ගුත්තරනිකාය (දසකනිපාතය) බු:ජ:
- පාරාජිකපාළි (විනය පිටකය) බු:ජ:
- මහාවග්ගපාළි (විනය පිටකය) බු:ජ:
- පපඤ්චසූදනී (මජ්ඣිමනිකාය අට්ඨකථාව) හේ:මු:
- අභිධර්ම මාර්ගය - අතිපූජනීය රේරුකානේ චන්දවිමල මහානාහිමි.